

# අනාගත වංශ දේශනාව

## (මෛත්‍රෙය වර්ණනාව)

සියලු බුද්ධාංකුරයන් විසින්

නිතර ඇසීමට

ප්‍රිය උපදවන්නාවූ අතීත කථාව

සහිත

# අනාගත වංශ දෙශනාව.

තව

# මෛත්‍රෙය වර්ණනාව

කියාද ව්‍යවහාරසී.

බී, සී, කුරේගෙන් බලාගෙන්

ඩබ්ලිව්. ඩී. පෙරේරා

විසින්

කොළඹ විද්‍යාදර්ශී යන්ත්‍රාලයේ

අච්චුගස්වනලදි.

1-10-17.

# අනාගතවංශ දේශනාව.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

සම්බොධි නිම්මල පයොධි සමුබ්භවස්ස
යස්සුජ්ජ ලන්තනවචන්ජුති සන්තතීහි
සංකොචමෙන්ති පරවාදි මූඛාරවින්ද
වන්දෙ සදා තමතුලං මුනිරාජ චන්දං.

**සකල** ලොක ශිවඞ්කරවූ අප මහාබෝසතාණෝ පිරූ පාරමිතා ඇතිසේක් තුසිතපුරයෙන් චුතව කිඹුල්වත්පුර සුඬොදන මහරජානන් නිසා මහාමායානම් අගබිසව කුස පිළිසිඳ මව්කුසින් බිහිව පුන් සඳසේ ක්‍රමයෙන් වැඩී අසදෘශ රාජවිභූති ඇතිව ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් එකුන්තිස් හවුරුද්දක් ගිහිගෙයි වැස සත්දවසතුල ලැබෙන සක්විති රාජ්‍යශ්‍රිය හැරදමා මහාභිනිෂ්ක්‍රමණයකොට සත්වෙනි වර්ෂයෙහි වෙසඟ මැදි පොහෝදින අශ්වත්ථබෝධිද්‍රුමරාජ මූලයෙහිදී සකල මාර පරාජයකොට ලොව්තුරා බුඩරාජ්‍යයට පැමිණ ඉසිපතන්හිදී අඤ්ඤාකොණ්ඩඤ්ඤ සථවිර ප්‍රමුඛ බොහෝ දිව්‍යමනුෂ්‍යාදීන්ට නිර්වාණ නමැති අමෘත රසය පානයකරවා බිම්සර රජහුගේ ප්‍රතිඥාවෙන් රජගහනුවර වේලුවනාරාමයෙහි වැඩවාසයකර වදාරණකල්හි සුදුවුන් පියමහරජානන්ගේ ආරාධනාවෙන් රජගහනුවර සිට විසිදහසක් මහරහතුන් වහන්සේ පිරිවරා කිඹුල්වත්පුර නුවරට වැඩමවූ සඳ තමන් වහන්සේ නොවඳුම්හයි මානයකළ එක්ලක්ෂ සැටදහසක් පමණ ඥාතිමධ්‍යයෙහිදී වැඩහුන් ආසනයෙන් ආකාශයට පැණනැගී අචින්ත්‍ය අසදෘශ අනොපමෙය යමක ප්‍රාතිහාර්‍ය්‍ය පවත්වා ඥාති මාන මර්දනයකොට වැඩඋන්සේක.

**එ**කල්හි සැරියුත් සවාමීන් විසින් ආරාධනා කරණ ලදුව ගාථා දහසකින් ප්‍රතිමණ්ඩිතවූ පූර්වචරිතාපදාන සඞ්ඛ්‍යාත චර්‍ය්‍යාපිටකයාන් තගීත බුඩවංශ දේශනාව වදාළකල්හි අසංඛ්‍යයක් දෙවියන් සෝවාන් ඵලයෙහිද අසංඛ්‍යයක් සකෘදාගාමි ඵලයෙහිද කෙළලක්ෂයක් පමණ බ්‍රහ්මයන් අමාමහ නිර්වාණයටද පමුණුවාලූසේක.

**ඉ**ක්බිති ධර්මසෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ දෙවතාවන්ගේ ධර්මලොභය තව නුහුනුසේ දැක සිවුරු එකාංශකොට පොරවාගෙණ චක්‍රවර්ති රජකුහු ඉදිරියට පෙම්වඩා යන පරිනායක පුත් රුවනක්සේ පියෙන් පිය ඔසවා ගොස් බුදුරජානන් වහන්සේට මදක්

ලත්ව සිට නම්නව දෙහොත් මුදුනේතබා වැඳසිට මාගේ ස්වාමීදුරුවූ බුදුරජානෙනි නුබවහන්සේගේ විශෙෂවූ මේ දෙශනාව අසා මාගේද සියලු සතුන්ගේද සියලු ශංකාවන් දුරුව කියාහ.

තවද නුබවහන්සේ විසින් මතු මේ කප මෛත්‍රෙය නම් බුදු කෙනෙකුන් වහන්සේ උපදිතියි වදාරණ ලදහ—ඒ මෛත්‍රෙය බුදුහු කවරකලෙක උපදිද්ද කෙසේවූ බුඩශ්‍රියා ඇතියාහුද්දයි විශෙෂයෙන් අසනු කැමැත්තෙමියි ආරාධනා කලසේක—මෙසේ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ විසින් ආරාධිතවූ බුදුහු එෂීාවක්පිවි වෂීාවක් වස්නාසේ අනාගතවංශ දෙශනාවට පටන්ගත්සේක— හේ කෙසේදයත්?

මතු පහලවන්නාවූ ඒ මෛත්‍රෙය බුදුරජානන් වහන්සේ අතීත කාලයෙහි අනෙකාදීනව වශයෙන් සමාකීණීණවූ අනවරාග්‍ර සංසාර වෘත්තියෙහි චුති ප්‍රතිසන්ධි වශයෙන් ජාතියෙන් ජාතියෙහි සැරිසරා ඇවිදිනාසේක් බුඩ ප්‍රත්‍යෙකබුඩ ආයෳීශ්‍රාවකාදීවූ කල්‍යාණ මිත්‍රයන් සෙවනය භජනය පර්‍ය්‍යුපාසනය කෙරෙමින් අනෙකජාති කොටි ශත සහශ්‍රයක් මුළුල්ලෙහි පතිරූපදෙශ වාසයෙන් යුක්තව සත්පුරුෂ සෙවනය ධම්මශ්‍රවනය යොනිසොමනසකාරය ධම්මානු ධම්ම ප්‍රති පත්තියයි කියනලද චතුසම්පත්තිය පුරා මේ මහාභද්‍ර කල්පයට සොලසාසංඛ්‍ය කල්පලක්ෂයකින් මත්තෙහි දඹදිව මධ්‍යමණ්ඩලයෙහි ප්‍රභාවනන්තනම් චක්‍රවර්තිරජව අන්‍යන්‍ය සාධාරණවූ සප්තරත්නය කින් හා සතර මහා සෘඩියකින් යුක්තව දෙදහස් කොදෙව් පිරිවරා මහමෙර සතරදිග පිහිටි සතර මහද්වීපයෙහි ඇවිද සියලු සත්‍යයන් පඤ්චශීලයෙහි පිහිටුවා ප්‍රජාපාලනය කෙරෙමින් විද්‍යාධර පක්‍ෂීන් සමා නවූ අවිකලාංග ඇති මහාසෙනග පිරිවරා අමරගණානුබඩ දෙවෙන්‍ද්‍ර විභ්‍රමයෙන් චක්‍රවර්තිරාජ්‍යය කරණසේක—එකල මුහුත්තනම් සවීඥ කෙනෙකුන් වහන්සේ ලොකයෙහි පහලව සඩම්මදෙශනාවෙන් මහ ජනයා පහදවා නොයෙක් කෙලලක්ෂ ගණන් ආයෳී සමූහයා විසින් පිරිවරණ ලදුව මුලුලොව සහගමින් ගම් නියම්ගම් රාජධානි පිළි වෙළින් දනවූ සැරිසරණසේක. එකල ඒ ප්‍රභාවනන්තනම් සක්විති රජව උපන් මෙත් මහා බෝසත්‍ානන් වහන්සේ බුදුහු ලොකයෙහි පහලවූසේක, යනු අසා තිස්යොදුනෙක පැතිරසිටි මහා සෙනග පිරිවරා බුදුන්කරා එලඹ නොයෙක් රත්නයෙන් පූජාකොට අමාහැල් ලෙක ගැලෙන්නාක්හුමෙන් භක්ති ප්‍රෙමයෙන් බැසහෙව වැද නැගී සිට බුඩාලම්භන ප්‍රීතීන් පිත පිනා පිරිසත් හා සමග එකත්පස්ව හිඳ අෂ්ටාංග සමුපෙත මධුරභාරතීන් දෙසනලද සඩම්මය අසා අතිශයින් පහන්සිත් ඇතිව සප්තවිධ රත්නයෙන් හා සියලු උපභොග පරිභොග වස්තුවෙන් හෙබියාවූ චක්‍රවර්තී රාජ්‍යයහැර අසුන්වැද මහණව රතන සථවිරයන් වහන්සේ යයි යන නාමින් ප්‍රසිඩව ශාසන නැමති ආකාශ

තලයෙහි පූර්ණචන්ද්‍ර මණ්ඩලයසේ බැබලෙමින් ශීල සමාධ්‍යාදි ගුණ ධර්මයෙන් යුක්තව පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යානලාභීව වස්නාසේක් එම ජන්මයෙහි සර්වඥයන් වහන්සේගේ සද්ධර්ම මුඛයෙන් සතර පදයකින් යුක්ත ගාථාවක් අසමින් එහි අර්ථ විභාගකොට ශ්‍රවණනිමෙනතෙක්ම ෂට් අභිඥාවන් හා සමග සිව්පිළිසිඹියාපත් රහත් බවට පැමිණෙන්ට උපනිශ්‍රය ඇතිව සසරදුක් ගන්නා සත්වශීගයා කෙරෙහි කරණලද මහත්වූ කරුණාවෙන් සර්වඥතාඥානය ප්‍රාර්ථනා කොට එදවස් තමන් වහන්සේ මනුෂ්‍යාත්මභාවාදීවූ අෂ්ට ධර්ම සමෝ ධානයෙන් යුක්තව වීර්‍යාධික මධ්‍යම ශ්‍රද්ධා ඇතිව ශ්‍රෙදය බෝධිසත්ව යෙකින් විශෙෂයෙන්ම දානාධ්‍යාශය ඇතිව දානයෙහි ඇලී ජීවිතයද පරිත්‍යාගකොට දන්දීමෙහි බලවත්ව ඝටගත්තාවූ උත්සාහ ඇතිවූ සේක.

එකල දම්සභා මණ්ඩපයෙහි රැස්ව හුන්නාවූ භික්ෂූන් වහන්සේ එම්බා ඇවැත්නි, මේ දානාධ්‍යාශය ඇති මහණතෙම අනාගතයෙහි ශක්‍රදෙවෙන්ද්‍රව උපදීද්දෝ හෝ නොහොත් මාරව බ්‍රහ්මව උපදීද්දෝ හෝ නොහොත් බුදුවේද්දෝ යන මේ කථාවක් ඉපදවූ සේක.

එසමයෙහි මුහුනී නම් බුදුරජානන් වහන්සේ නොයෙක් අලං කාරයෙන් පිළියෙලකරණලද දම්සභා මණ්ඩපයෙහි විසිතුරුකොට පනවනලද උතුම් බුද්ධාසන මස්තකයෙහි සහශ්‍ර රශ්මින් සාගරකුක්ෂිය බබුලුවමින් උදයගිරි මස්තකයට පැමිණි තරුණ සූර්‍යයාමෙන් සියලු දම්සභාමණ්ඩපය රුවන් රස ධාරාවෙන් පරිසෙක කරන්නාක්මෙන් නීල පීත ලොහිතාවදාත මාංජෙෂ්ට ප්‍රභාස්වරයයි කියනලද ෂඩ්වර්ණ බුද්ධරශ්මිමාලාවන් බබුලුවමින් තාරකා සමූහයා විසින් පිරිවරණ ලද පූර්ණචන්ද්‍ර මණ්ඩලයමෙන් භික්ෂු සමූහයා විසින් පිරිවරණ ලදුව වැඩහුන්සේක් සුපිපි රත්පියුම් වනයක් මධ්‍යයෙහි සංචාරණය කරන්නාවූ පස්වණක් පැහැයෙන් හෙබියාවූ හංස යුගලයක් හා සමානවූ පස්පෑ දිස්නා විසිතුරු ඇස්යගලින් සියලු භික්ෂු සමූහයා බලා ඔබ හැමදෙනා වහන්සේගේ අදහස් දන සිව්දූගඳින් පිරූ රුවන් කරඬුවක් අරණකලක් පරිද්දෙන් භික්ෂුසංඝයා වහන්සේ සතුටුකර වමින් මුඛපද්මය විදහා අෂ්ටාංගයෙන් සමන්විතවූ බ්‍රහ්මස්වර විහිදුවා එම්බා මහණෙනි! මේ රත්න නම් මහණ එසේ මෙසේවූ ලාමක සත්ව යෙක් නොවෙයි බුද්ධාංකුරයෙක මේ තෙම මතු අනාගතයෙහි සොලසාසංඛ්‍ය කල්පලක්‍ෂයක් ගියකල මා සේම සම්‍යක්සම්බොධි සම්භාරය පුරා මෛත්‍රෙය නම්වූ ලොවුතුරා බුදුවෙයි.

ඒ බුදුවන ආත්මභාවයෙහි මොහුට කේතුමතීනම් රාජධානියෙක් වාසස්ථාන වෙයි, එහි සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුකෙනෙක් රාජ්‍ය කෙරෙති. ඒ රජ්ජුරුවන්ට අග්‍ර පුරෝහිතවූ සුබ්‍රාහ්මණනම් බ්‍රාහ්මණ උතුමානන් කෙනෙක් පියවන්නාහ— බ්‍රහ්මවතීනම් බැමිණි දේවී

කෙණෙක් මව්වන්නාහ—අශෝකය බ්‍රහ්මදෙව යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වන්නාහ—සිංහනාම් මහතෙර කෙනෙක් උපස්ථායක වන්නාහ—පදුමය සුමනය යන අග්‍ර ශ්‍රාවිකා දෙදෙනෙක් වන්නාහ—සුධනය සංඝය යන උපාසකවරු දෙදෙනෙක් අග්‍ර උපස්ථායක වන්නාහ—යසවතිය සංඝාය යන උපාසිකාවරු දෙදෙනෙක් අග්‍ර උපස්ථායිකා වන්නාහ—නාග වෘක්ෂයක් බෝධිවන්නේය—අසූඅටරියනක් උස බුද්ධ ශරීරය වන්නේය—බ්‍රහ්මප්‍රභා මණ්ඩලය පස්විසි යොදුනෙක පැතිර සිටින්නේය—අසූදහසක් අවුරුද්දට ආයුවන්නේය—මෙසේ විවරණශ්‍රී දී වදාරා සතුති කොට හුනස්නෙන් නැගී ගඳකිළියට වන්සේක.

ඉක්බිති මහා පුරුෂයානන් වහන්සේ සන්තුෂ්ටවූ සිත්ඇතිව දිව්‍ය මනුෂ්‍යයන් විසින් පුදනලදුව බුද්ධකාරක ධර්මයන් පරීක්ෂා කරණසේක්.

දානං සීලඤ්ච නෙක්ඛම්මං පඤ්ඤා විරියෙන පඤ්චමං.
ඛන්ති සච්ච මධිට්ඨානං මෙත්තු පෙක්ඛා ඉමෙ දස.

යනාදීන් දක්වනලද දශපාරමිතාවන් දක අනුලොම ප්‍රතිලොමාදි වශයෙන් මර්මණය කෙරෙමින් දසදහසක් සක්වළ මෙරු යුගන්ධරාදීන් කම්පිතකරවා මෙයින් අන්‍යවූ බුද්ධකාරක ධර්මයෙක්නම් නැත්තේයයි නිෂ්ඨාවට පැමිණ දෘඪසමාදානකොට එතැන්පටන් අවීචිමහ නරකාදිවූ අටලොස් අභව්‍යස්ථානයකට නොපැමිණ සොලසාසංඛ්‍ය කල්ලක්ෂයක් මුළුල්ලෙහි නිරතුරුව වඩනලද එකාකාර වීර්‍ය්‍යඇතිව දශප්‍රකාර පාරමී ධර්මයන් පුරා සමතිස් ආකාරයකින් මස්තකප්‍රාප්ත කොට අප මහා ගෞතම බුදුරජානන් වහන්සේ බුදුවන්නාට පළමු කොට තුසීදිව්‍යලොකයෙහි ඉපිද අප්‍රමාණවූ දිවසැපත් විඳිමින් දෙවියන්ට ධර්මදෙශනා පවත්වා තෙසුවහස් දිව්‍යරාජයන්ගේ කිරුළුකුළුමිණිරැසින් තමන්වහන්සේගේ පාදපද්මය බබුලුවා සමෘද්ධශ්‍රීන් යුක්තව ඒ තුසිතපුරයෙහි දූන් සහ පිරිවරින් වාසයකරණසේක.

කවරකලෙක බුදුවෙනසේක්දයත්? අප මහා ගෞතම බුදුන්ගේ මේ කරුණාශාසනය පන්දහසක් අවුරුදු පැවැති කල්හි එයින් මත්තෙහි අකුශල ධර්මයන්ගේ උත්සන්නවීම හෙතුකොටගෙණ සත්වයන්ගේ ආයුසංස්කාරය ක්‍රමයෙන් පිරිහී දසඅවුරුද්දට පරමායුෂවෙයි. එකල සත්වයෝ තිරිසනුන් වැනියහ. මව්පියෝයයි වෙනසක් නොදනිති. නැගනියෝය බුහුනනියෝය මලනුවෝය බෑනනුවෝය දියනියෝය යනාදී ව්‍යවහාරයක් නැතිව තමන් කෙරෙහි ප්‍රෙමකෙරෙති. පස්මැසි කුමරුවන්ට පස්මැසි කුමාරිකාවන් සරණපාවාදෙති, සියලුම රස අනන්තහීනවෙයි. අමු මෙනේරි වරා ආදීවූ කවුරස සාලේ බත්ම රජදරුවන්ට අග්‍ර භොජනවෙයි, මෙසේ ලොව සියලු සැපතින් හීනවූ

කල්‍රහී:—යම කි නිද්දනවග්ගයෙහි කී පරිද්දෙන් රොගාන්තඃ කල්පය ශස්ත්‍රාන්තඃ කල්පය දුර්භික්ෂාන්තඃකල්පයයි කියනලද ත්‍රිවිධවූ අන්තඃකල්පයන් අතුරෙන් දැන් සත්ත්වයාගේ ද්වේෂය උත්සන්නබව හෙතුකොටගෙණ සත්ථන්තරනම් කල්පයකින් ලොකය විනාශවෙයි-යෙහි කෙසේදයත්?

අන්තඃකල්පය නස්නට පළමු සත්දවසක් තිබෑද්දී කාමාවචර දෙවතාකෙනෙක් අවමගුල් වෙස්ගෙණ මිනිස්ලොව ඇවිද සත්ත්වයෙනි මෙයින් සත්දවසක් ගියකල මෘගසංවර්‍ෂාව යයි යන විනාශකර මහා වර්‍ෂාවෙක් සත්දවසක් මුළුල්ලෙහි ධාරා නිපාතයෙන් වස්නේය, එහි තෙමුනු කෙනෙක් ඔවුනොවුන් ඇසට මුවන්සේ පෙනෙති, එකල උනුනුන්ගේ ජීවිත විනාශය කෙරෙති, දිවිරක්නා කැමතිකෙනෙක් ඒ සත්දවසට දර පැන් බත් සාල් ලුනු ඇඹුල් රැස්කොට ගල්ගුහා ආදියෙහි තබාගෙණ වැදහිඳ දිවිරකුවයි කිය කියා කෙලලක්‍ෂයක් සක්වල ඇවිදිති, එබස් අසා සත්ත්වයෝ තමන් ස්වභාවයෙන්ම අඥාන හෙයින් ඒ දුටුවෝ කවුරුදැයි ඒ දූත ආවෝ කවුරුද එනම් කුමන බසෙක්දැයි නොගිවිස සිතාසෙති සමහර නුවනැති කෙණෙක් කවුරු දනිද්ද දෙවියන් කීලෙස කරම්හයි ගල්ගුහා පර්‍වතගුහා ආදියෙහි දෙදෙනෙක් ඔහුනොවුන් ඇසට නොපෙණෙනසේ ඉඳින්.

එකල මෘගසංවර්‍ෂාව කෙලලක්‍ෂයක් සක්වල එකහෙලා ධාරා නිපාතයෙන් වසින්ට පටන්ගන්නේය පොද බිඳුවකින් තෙමුනාවූ කෙනෙකුදු ඔවුනොවුන් ඇසට මුවන්සේ පෙනෙති, කොලතෙල මුවා ගණුව මරව අසුකරවයි කිය කියා ඔවුනොවුන් ලුහුබඳවා ගණිති තණපත් පරඬලාපත් සියුම් මුවහත්ඇති කඩුපත්සේ මැවීයෙයි ඒ සත් දවස මුළුල්ලෙහි සත්ත්වයෝ මෙසේ ඔවුනොවුන් මරා මුලුපොළව එක මස් කලවිටක්සේ ලේ මූද කෙරෙති. ඉක්බිත්තෙන් වැහි හල කල ජීවත්වූ කෙනෙක් එළිබැස මල මල තැනන්ගේ පොළගෙණ තිබෙන අතුල් පතුල් ඉස් කන් නාසා ආදිවූ ඇඟමස් දැක අපගේ නෑයෝ අප කියමන් නොගෙණ දැන් හැම්දෙනම නටහයි මහත් කරුණා උපදවා අපා හැම ජීවත්වූ ගණන ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී උපදවා මෙතැන් පටන් ප්‍රාණවධ නොකරම්හයි පළමුකොට ප්‍රාණතිපාතය දුරුකෙරෙති, ඒ කුශලයෙන් ඔවුන් වැදූ දරුවන්ට විසිඅවුරුද්දට ආයු වෙයි, ඔවුන් දෙවෙනිව අදත්තාදානය හැරපියති, ඔවුන් වැදූ දරුවන්ට තිස්අවුරුද්දට ආයු වෙයි, තුන්වැනිව පරදාරය හැරපියති, ඔවුන් වැදූ දරුවන්ට හතලිස් අවුරුද්දට ආයු වෙයි, සතරවෙනුව මුසාවාදය හැරපියති, උන් වැදූ දරුවන්ට පණස් අවුරුද්දට ආයු වෙයි, පස්වැනිව පිසුනාවාචය හැරපියති, උන් වැදූ දරුවන්ට සැට අවුරුද්දට ආයු වෙයි යනාදී ක්‍රමයෙන් ඵරුෂ වචනය සම්ඵප්‍රලාපය අභිධ්‍යා ලොභය අධික ද්වේෂය විපරිත දෘෂ්ටිය යන මේ දශවිධ අකුශල

කර්මයන් හැර දශවිධවූ කුශල කර්මයන් කෙරෙහි පිහිටා යෙති, ඒ කුශල කර්මයන්ගේ අනුභාවයෙන් ක්‍රම ක්‍රමයෙන් වැඩී දෙසියයක් අවුරුද්දට ආයු වෙයි, එකලට දඹදිව ඉතා සමෘද්ධව හුණුවණයක් බව වණයක් මෙන් අතුරු නැතුව මනුෂ්‍යයන් ගැවසී සිටින්නේය, කුකුළු පියාසර ගම් නියම්ගම් රාජධානි සමෘද්ධවන්නේය. සියලු ජනපදයෝම සොරුන් සතුරන්ගෙන් භයනැති හෙයින් සුඛිතවන්නාහ, එකල බරණැස්නුවර එම නමින් ව්‍යවහාර වෙයි.

නැවද එයින් මත්තෙහි කුශල ධර්මය වැඩීයේ, සත්වයාගේ ආයුෂ ක්‍රමයෙන් වැඩී අනූදහසක් අවුරුද්දට පරමායු වෙයි, එකල බරණැස් නුවරනම් පෙරලී උප්පලනම් නුවරෙක් වෙයි, එම නුවර දිගින් පලලින් යොදුනක් පමණ මහත්ව සමෘද්ධවෙයි; එයින් මත්තෙහි නවද ආයුෂ ක්‍රමයෙන් වැඩී ලක්‍ෂයක් අවුරුද්දට වූකල උප්පලනම් නුවර නම් පෙරලී අයන් විතරින් සත්යොදුන් පමණ ඇති පදුමනම් නුවරෙක් වෙයි, නවද වඩ වඩා කුශල කර්මයාගේ බලයෙන් අසංඛ්‍යයක් අවුරුද්දට ආයු වෙයි. එකල පදුම නුවර යන නම් පෙරලී දෙලොස් යොදුන් අයන් විතරඇති මඬුරනම් නුවරෙක් වෙයි, ඒ අව දියට මිනිස්ලොව ආයුශක්තින් වේද ලොවටත් වඩනේමය.

එසේ හෙයින් කියනලදී.

> සම්ඩි ගාමා නිගමා පුරවරා
> බහු භවෙ අඩ්ඩකුලෙහි ආකුලා
> සජම්බුදීපො සුරමාසතොධිකො
> භවෙය්‍ය තස්මිං සමයෙ පතායුතා.

මෙසේ කල්හි මනුෂ්‍යයෝ බොහෝ සෙයින් උපන්කල් නොද නිති මියනකල් නොදකිති ජරා විලි පිළි නැත රොගාන්තරා නැත මෙසේ සුවදුක් නම් කෙසේබවත් නොදන සත්වයෝ කුසල් කිරීමෙහි ප්‍රමාදවෙති, ඒ අකුශලයෙන් ආයු පරිහානියට පැමිණ ක්‍රම ක්‍රමයෙන් අසූදහසක් අවුරුද්දට ආයු වෙයි, පන්සියයක් හැවිරිදි කුමරුවන්ට පන්සියයක් හැවිරිදි කුමරියන් සරණපාවාදෙති, මුලු දඹදිව සියලු උපභොග පරිභොග වස්තූන් හා පඤ්චකාම සම්පත්තියෙන් සමෘද්ධවන්නේය. වර්ෂාවද දෙපොයෙන් දෙපෝයෙහි දවසින් දවස මධ්‍යම යාමයෙහි භූමිරශයට වඩිමින් වස්නේය, එකල මඬුරානම් නුවර නම් පෙරලී දිග දෙලොස් යොදුන් පුළුල සත්යොදුන් අවටින් තිස් යොදුන් පමණ ඇති කෙතුමතීනම් රාජධානියෙක් වෙයි:— ෧

වදාලේ මැනෙ!.

> තදා කෙතුමතී නාම රාජධානී භවිස්සති
> ද්වාදස යොජනායාම සත්තයොජන විත්ථතා. ෧

තවද පෙර දිඹුල්දඹෙන් ගෙයක් තන්වා සත් පසේබුදුකෙනෙකුන් වහන්සේ වස්වසවා පින්කල කුළුපොතු දෙපිය කෙනෙකුන්ගෙන් පුතනුවෝ සදෙව්ලොව ඔබිනොබ සැරිසරා සැපත් විඳිමින් මිනිස්ලොව මහාපනාද නම් රජව ඉපද පස්විසි යොදුන් උස ඇති සත්රුවන් මාලිගාවෙක වෙසෙමින් එහි මත්තෙහි සිට හටන්නාවූ දසදහසක් පමණ නාලුනාටකයන්ගේ නෘත්‍ය ගීත වාද්‍යයෙන් සතුටු කෙරෙමින් සොළොස් දහසක් සුරඟනාවන් හා නොයෙක් දහස් ගණන් අමාත්‍යමණ්ඩලයා විසින් පිරිවරණලදුව ශක්‍රදෙවේන්ද්‍ර ලීලාවෙන් අසංඛ්‍යයක් අවුරුදු රාජ්‍යයකොට දෙව්ලොව ඉපද දිවසැපත් වළඳා නැවත අප බුදුන් සමයෙහි මිනිස්ලොව භද්දියනම් නුවර ඒ නමින් සිටුව ඉපද මහා සම්පත් විඳ බුදුන්ගෙන් බණ අසා සසුන් වැද මහණව නිවන් දුටහ පියානෝ තමන් කල පින් වැඩිතරම් හෙයින් මෙම බුද්ධාන්තරය මුළුල්ලෙහි සදෙව්ලොව සැරිසරා දිව සැපත් විඳ එකල කෙතුමතීනම් රාජධානියෙහි සංඛනම් චක්‍රවර්ති රජව උපදනාහුමය. ඒ රජ්ජුරුවන් පෙර කල ආවාස දානයෙහි කුසලයෙන් පළමු කී මහාපනාද රජ්ජුරුවන් විසූ පස්විසි යොදුන් උසඇති සියයක් මාල්ඇති සවාසූදහසක් රුවන් ගබඩාඇති ඉන්ද්‍රනීල මාණික්‍යමයවූ බිම්ඇති ස්වර්ණමයවූ වැම්ඇති රිදීමයවූ කොතුරු හා පේකඩඇති ප්‍රවාලමයවූ වාසුපඩකානි ඇති රත්මයවූ එල සෙවෙනි ඇති සත්රුවන්මය මහාපාය ගගණමගින් ආකාශතලයට පැණ නැගී දෙවෙනි සඳමඬලක්සේ දසදික් බබුලුවමින් අවුත් නුවර මැද පිහිටායෙයි චක්‍රරත්නය හස්තිරත්නය අශ්වරත්නය මාණික්‍යරත්නය පරිණායක රත්නය ග්‍රහපති රත්නය ස්ත්‍රී රත්නය යන සප්තවිධ රත්නයන් පහලවෙයි. ඒ රජතුමා හා සමබල ඇති දහසක් පුතුන් ඇතිවෙයි ආකාශයෙන් යන ඍද්ධි ඇතිවෙයි ශරීරයෙන් සඳුන් සුවඳ වහණය වෙයි මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමයි දෙවියෝ සතර දෙනෙක් සතරදිග කඩුගත් අතින් රැකවල් ගෙණ සිටිති. ඒ රජහුගේ ආතතවිතානාදිය ගත්තාවූ තුයසිමස්තාව දෙලොස් යොදුනෙක පැතිර සිටිති. බ්‍රාහමණ මණ්ඩලය පස්විසි යොදුනෙක පැතිර සිටිති සර්වාභරණයෙන් සැරහී නානාවර්ණ අංගරාග ගල්වා පඤ්චායුධ සන්නාහවූ අමාත්‍ය මණ්ඩලයම අටසාළිස් යොදුනෙක පැතිර සිටිති. අවශෙෂ පිරිසත් මණ්ඩලය අනුයොදුනෙක පැතිර සිටිති. සත්රුවන්මය විචිත්‍ර සන්නාහව නානාප්‍රකාර ආයුධ සමූහයෙන් දසදික් හොබවා පන්සියයක් යොදුනෙක පැතිර සිටින මහත්වූ යොධ සේනාවක්ද වන්නේය. හාත්පසින් සතරදිග සුවාසූ කෙලදහසක් පමණ ඇත් අස් ආදීවූ චතුරඟිනි සේනාව සිටිති. මෙසේම දඹදිව් සවාසූ දහසක් රාජධානි වෙයි. එහි අනුකෙල ලක්ෂයක් අභිෂෙකලත් රජදරුවෝ වසන්නාහ. ඒ සියලු රජදරුවෝම නිරන්තරයෙන් සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුවන් පිරිවරා සිටින්නාහ. එකල සංඛනම් චක්‍රවර්ති

රජ්ජුරුවෝ සර්වාභරණයෙන් සැරහුනාවූ දිව්‍යප්සරාවන් හා සමාන රූපශොභාවන් ඇතිව නැටීම් ගී කීම් බෙරගැසීම් වස්කුලල් පිඹීම් ආදිවූ චතුරඞ්ග සඞ්ගීතයෙහි දක්‍ෂවූ භාවහාවලීලා කටාක්‍ෂර මන්දසඞ්ගීතයෙන් යුක්තවූ සවාසූදහසක් නාටකස්ත්‍රීන් පිරිවරා දිව්‍යසම්පත් ශුක්ම පවත්නාවැනි මහත්වූ ශ්‍රී විභූතින් යුක්තව ඒ සත්රුවන් මහාපායෙහි වෙසෙමින් සියලු පෘථිවිමණ්ඩලයට අනුශාසනා කරන්නාහුමය.

එසේ අනුශාසනා කරන්නාහුද තම තමන්ගේ ප්‍රමාණාතික්‍රාන්තවූ මහසෙනඟ පිරිවරා තරුපිරිවැරූ පූර්ණචන්ද්‍රයාසේ මහත්වූ රාජානුභාවයෙන් පන්සියයක් කොදෙව් පිරිවරා මහමෙරදිග පිහිටි සතර මහ ද්වීපයෙහි අහසින් ඇවිද සියලු සත්වයන් පව්නොකොට පන්සිල් රක්නාසේ අවවාද කියා දහවල් බතට තමන්ගේ මාලිගාවටම එන්නාහ. වදාලේ මැනෝ.

සංඛොනාම සො රාජා අනන්තබල වාහනො
සත්තරතන සම්පන්නො චක්කවත්ති මහබ්බලො
ඉඬ්ඩිමා යසසාචෙව සබ්බකාම සමප්පිතො
හත පච්චත්තිකං ඛෙමං අනුසාසිස්සති ධම්මතො.

තවද කෙතුමතීනම් රාජධානිය කොවේ මහවේ ආදි ඒ ඒ ස්ථානයෙහි රන්ධජ රිදීධජ රන්පතාක රිදීපතාක රන්තොරණ රිදීතොරණ රන්ඇගෑ රිදීඇගෑ පුන්කලස කෙහෙල් තොරණ ආදියෙන් සැරහී තිබෙන්නේය. නානාප්‍රකාර විස්තර ජාතීන්ද රන් රිදී මුතු මැණික් ආදිවූ අනෙකප්‍රකාර වස්තුවෙන්ද එසේම අසො වස්තුවෙක් මෙහි නැතැයි නොකියහැකි සර්වප්‍රකාර සුගන්ධ ද්‍රව්‍යයෙන් හා නොයෙක් කටුක භාණ්ඩාදින් බබලන්නාවූ සල්පිල් පෙළින් ශොභනේය. තවද ප්‍රසන්නවූ නිර්මල මිහිරි සිහිල් ජලතලාවෙන් යුක්තව රක්තසෙවතාදී පඤ්චප්‍රකාර පත්මොත් පලයන්ගේ සුගන්ධ ගන්ධයෙන් බන්ධුරවූ දිව්‍යමය පුෂ්කරණී පන්තීන් හා පතැස්පෙළින් ශූැවසී සිටගත්තේය. තවද ඒ ඒ තන්හි මනහර අතගල් පෙලින් හා සුපුෂ්පිත ඡායා වෘක්‍ෂ සමූහයෙන් සමෘඩවෙයි. එසේම පලුපල්ලව කුසුමයෙන් සශ්‍රීකවූ අඹ දඹ පනා කොබොලීල පලොල් ඇසළ මුහුලු නඳුන් සඳුන් දෙව්දුරු කපුරු දෙල් බෙලි ආදිවූ දිව්‍ය වෘක්‍ෂ සමූහයෙන් සැරහී සිටින්නාවූ දිව්‍යමය උද්‍යාන පන්තීන් ශොභමාන වන්නේය. එකල්හි සෙසුද තබා එසේම පොකුණු පතැස් උද්‍යාන ආදීහුම ඒකාවන්ව මහජනයාට සන්තොෂ එලවන්නාහුය.

එසේහෙයින් කියනලදී.

සා පොක්ඛරා පොක්ඛණී විභූසිතා
තහිං තහිං නෙක සුඵුල්ල පාදපා
සිලාතලුය්‍යාන පරම්පරා ඝාද
ඝණ ජනානන්ද වාහා මනොරමා.

තවද ඒ කේතුමතීනම් රාජධානියෙහි පොළොව පලා නැගී සත් රුවන්මය පහපවුරු සතෙක් නුවර සිසාරා සිට රූ දැවිලැසි යන වෙන සක් නොදක්වා ප්‍රභාමත් කෙරෙයි. එයින් පවුරුවිලල්ලක් සතරත් මය, එකෙක් වෛඩූර්‍ය්‍ය මාණික්‍යමය, එකෙක් මසාරගල්ල මාණික්‍ය මය, එකෙක් සත්රුවන්මය වින්නේය. සත්රුවන්මය මහපවුරු උසින් සැටරියන් පමණ මධ්‍යයෙහි පිහිටන්නේය. රන් රිදී වෛරළු මිණිමය තුන්පවුර එම සත්රුවන්මය මහපවුරෙන් පිටත අනුක්‍රම යෙන් එකිනෙකට මිදීව පිහිටන්නේය. පිළිවගනය ලෝහිතාංකය මසාරගල්ලය යන තුන්පවුර සත්රුවන්මය ඒ පවුරට ඇතුල පිට අනුක්‍රමයෙන් එකිනෙකට මිදීව පිහිටන්නේය. තවද ඒ සත්රුවන් මය සත්පවුර අතරෙහි අසුරියන් උසඇති ස්වර්ණරත්මයවූද, රිදීමයවූද, වෛඩූර්‍ය්‍ය මාණික්‍යමයවූද, ස්ඵටික මාණික්‍යමයවූද, ලෝහිතාංක මාණික්‍යමයවූද, මසාරගල්ල මාණික්‍යමයවූද, සර්වරත්නමයවූද තාල පන්තීනු සත්දෙනෙක් වටින් වටගසා පිහිටන්නාහ. එයින් ස්වර්ණමයවූ තාල්පන්තිය ස්වර්ණත්මයවූ ප්‍රාකාරය සමීපයෙහි පිහිටන්නේය. රජතමයවූ තාලපන්තිය රජතමයවූ ප්‍රාකාරය සමීපයෙහි පිහිටන් නේය. ස්ඵටිකමයවූ තාලපන්තිය ස්ඵටිකමයවූ ප්‍රාකාරය සමීප යෙහි පිහිටන්නේය. ලෝහිතාංකමයවූ තාලපන්තිය ලෝහිතාංකමයවූ ප්‍රාකාරය සමීපයෙහි පිහිටන්නේය. මසාරගල්ලමයවූ තාලපන්තිය මසාරගල්ලමයවූ ප්‍රාකාරය සමීපයෙහි පිහිටන්නේය. සර්වරත්නම යවූ තාල්පන්තිය සර්වරත්නමයවූ ප්‍රාකාරය සමීපයෙහි පිහිටන්නේය. තවද ඒ කේතුමතීනම් රාජධානි නුවර සතරදිශාවෙහි සත්රුවනින් විසිතුරුවූ වාසල් සතරෙක් මැවී සත්මහල්ව නුවර අලංකාර කෙරෙයි. එම සත්රුවන් වාසල්දොර කප්රුක් සතරෙක් පොළව පලා පැනනැගී නන් විසිතුරුවූ වහසල් අනේකප්‍රකාරවූ සම්පත්තීන් සැරහී සිටින්නේය, මුළු දඹදිව සත්වයන් කැමති කැමති වස්ත්‍රාභරණාදිය ඉදිපී එක කප්රුකකින් නෙලාගියත් අසූදහසක් හවුරුදු මුළුල්ලෙහි හැඳ නිමවාගත නොහැක්ක. තවද ඒ නුවර මැද සත් රුවන්මය ශාලාවකුදු පහළවන්නේය. ඒ ශාලාව සතරදිග කප්රුක් සතරෙක් මැවීතිබෙයි. එසේම ඒ නුවර වීථි චතුෂ්ක කොත් ආදිවූ ඒ ඒ තන්හි සර්වරත්නමයවූ දිව්‍යානුභාවයෙන් සියගණන් කල්ප වෘක්ෂයෝ සර්වසම්පත්තීන් සජ්ජිතව සිටිනාහ.

ඒ කේතුමතීනම් රාජධානියෙහි තණින් පතින් කළ ගෙයක වසන්නාවූ එකම සත්වකෙනෙකුත් නැත, සත්රුවන්මයවූ විසිතුරුවූ ප්‍රාසාදවලම වාසය කෙරෙති, එකල්හි දඹදිව මුළුල්ලෙහි සත්වයන් කෙත් සාන වපුරණ කෙණෙක්වත් වෙළඳාම් නවාම්කරණ කෙණෙක් වත් බඩගිනිනිසා දුක්ගන්නාවූ එකද මනුෂ්‍යයෙක් නැත, සුදුසු භූමි ප්‍රදේශවල පොළොව පලාගෙන ද්‍රව්‍යාවූ ස්වයංජාත හැල්කරල්වල

කුඩුනැතිව මුතුසේ පැහැපත්ව සුවඳඇල් සාල් ගෙණ තිබෙයි. එක බිජුවටක් හුණුතෙතින් නැගි පඳුරෙක කරල් කපා මැඩගත්කල දෙදහස් දෙසිය දෙසැත්තෑ ගැලක්පුරා සොළසාමුණු අටලාසක් සාල් ඉතිරීව තිබෙයි. ඒ සාල් රත්බදනෙකලා මැණික් උදුනෙහි තබා ජෝතිරස පාෂාණයෙන් නැගි ගින්නෙන් බත් පැසුනුකල්හි ඒ බත් රසමයවූලෙන් යුක්තකොට හැම සත්‍වයෝම අනුභව කරන්නාහ, සත්‍වයන් මලමුත්‍ර කරම්හයි සිතූ වේලෙහි නිල්වලාකඩෙක් දිවගණ අවුත් තිරයක්සේ සිසාරා සිටගන්නේය. එකෙණෙහි පොළව පැලී මහ වලෙක් මැවීයෙයි, එහි ශරීරකෘත්‍යය කළකල්හි ඒ වල අන්තර්ධානව පැන් පොකුණක් මැවීයෙයි, එයින් උදකකෘත්‍යය කළකල්හි ඒ වලාකඩ අන්තර්ධානවෙයි, මෙසේ ඒ කෙතුමතීනම් රාජධානිය හැමලෙසින්ම දිව්‍යපුරයක් හා සමානය.

එසේ හෙයින් කියනලදී.

අනන්තභොගෙහි ජනෙහි පූජිතං–මනුඤ්ඤපාසාද මනෙක තොරණං
සුභගං පුරං දෙව පුරංව භාසුරං–පුරමහමෙ කෙතුමතී'ති විස්සුතං.

නැවද ඒ කෙතුමතීනම් රාජධානිය පරිද්දෙන් දසදහසක් යොදුන් මුලු දඹදිව්තලය එකලට එකමමගුල්ගෙයක්සේ සැරහී සමුණිවතිබෙන හෙයින් ඒ කෙතුමතීනම් රාජධානිය ඇතුලුවූ මුලු දඹදිව වැසි සියලු ස්ත්‍රී පුරුෂයෝම ඒ ඒ තන්හි පහලවූ අතිධවල වැලිතලායෙන් යුක්තව ප්‍රසන්නවූ මිහිරි සිහිල්දිය පිරී සත්රුවන්මයි පියගැට පන්තියෙන් ගැවසීගත් හංස චක්‍රවාකාදී අනෙකප්‍රකාර පක්ෂි සමූහයා විසින් රාව පිළිරාව දිදී ඇඹුල උපුල හෙල්මැලි රත්නෙලුම් හෙළනෙලුම් ආදිවූ පඤ්චප්‍රකාර පද්මොත්පලයෙන් ගැවසීගත් මනහර පොකුණුවල තම තමන්ගේ අභිප්‍රාව පරිද්දෙන් ජලසනානයකොට දිවසුවඳ විලවුන් ගෙණ දිවමල් පැලඳ කප්රුක්වලින් තම තමන් අභිප්‍රානුකූලවූ පරිද්දෙන් දිවපිළි හැඳ පෙරවා දිව්‍යාභරණයෙන්සැරහී උක්තප්‍රකාර සුවඳ ඇල්සාලේ බත් අනුභවකොට දිව්‍යමයවූ නොයෙක් ඇතිප්ලි අතුරණ ලද මාහැගි යහන්හී වැදහෙව දිව්‍යමයවූ ගාන්ධර්වයන් හා සමාන නාටක ජනයන්ගේ නොයෙක් නැටීම් ගීකීම් බෙරගැසීම් ආදිය බලමින් අසමින් සැපසේ නිදිගෙණ එම ගසන පිඹින හඬින් නැවත පිබිද සුවඳතෙල් පහන් ආලෝකයෙන් තම තමන්ගේ නොයෙක් සම්පත් හා ශ්‍රී සමෘඩිය දක්නාහු ධන ධාන්‍ය හස්ති අශව දැසි දස කම්කාරාදි සමෘඩිය සිහිකරමින් විශෙෂයෙන් සන්තුෂ්ටවූ සිත් ඇතිව සියළු උපභොග පරිභොග වස්තුවෙන් සම්පූර්ණව කායික චෛතසික සැපයෙන් යුක්තව හැම්කල්ම මහත්වූ අධික සැප අනුභව කරන්නාහ, එකල්හි සියළු සත්‍වයන්ටම අටඅනුවක් රොග නවඅනුවක් ව්‍යාධි දෙසියතුනක් අන්තරාය යන මෙයින් කිසිවකිනුත් ව්‍යසනයෙක් නොවන්නේය. දිව්‍ය ශරීර හා සමාන නිරොගි ශරීර ඇතිවන්නාහ.

එසේ හෙයින් කියනලදී.

යසවිභව සමිද්ධිං පෙක්ඛමාණ ජම්බුදීපා
සතත මුදිත චිත්තා පඤ්චකාමෙ චරන්තා,
විවිධ සුරභි භූසං භූසිතත්තාසු රූපා
විගත සකල රොගා දෙවදෙහාවභොන්ති.

මේ ඒ සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුවෝ පෙර දිඹුල්දණ්ඩත්කල ලැගුත්ගෙයි පිනින් ඒසා මහත් ප්‍රාසාදයක් ලැබේ. එහි ලාලූ ඇඳෙහි පිනින් සුවාසූදහසක් යහන් ලැබෙයි, එක ඇතිරිලියෙහි පිනින් සුවාසූදහසක් ආස්තරණ ලැබෙයි, බැලමෙහෙකොට දුන්නාවූ දනයෙහි පිනින් දිව්‍යභොජන ලැබෙයි, ඒ ගෙයි ලාලූ එකපීඨයෙහි පිනෙන් සුවාසූදහසක් සිංහාසන ලැබෙයි, රැක්කාවූ ශීලයෙහි පිනින් එකල සමසිතින් දන්පිසූ ස්ත්‍රිය ප්‍රධානකොටඇති සුවාසූදහසක් බිසෝවරුන් ලැබෙයි, පන්සලවට වැටකරවාලූ පිනින් නුවරවට සත්රුවන් පවුරු සතෙක් මැවෙයි, වෙහෙරට ඉඳුවාලූ තල්පැලෙහි පිනින් සත්රුවන්මය තල්ගස් සත්වලල්ලෙක් නුවර සිසාරා පැනනැගී සිටින්නේය, සාරමසක් වස්වසවා දුන් පානීය භොජනාදියෙහි පිනින් සත්රුවන් ලැබෙති, වස් අන්තයෙහි තෘවරදවා දුන් වස්වාසික සිවුරු පිළියෙහි පිනින් ඒසා මහත් කප්රුක් සමූහයක් ලැබෙති, මෙසේ ඒ සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුවෝ එකල කෙතුමතී නම් රාජධානියෙහි ශක්‍රදෙවෙන්ද්‍ර ලීලාවෙන් රාජ්‍යශ්‍රී විඳින්නාහ.

එකල මෙසේ මිනිස්ලොව දෙව්ලොවටත්වඩා සියල්ලෙන්ම සමෘද්ධව අසූදහසක් අවුරුද්දට පරමායු කල්හි මේ මඟුල්සක්වළ පිරිවරා සිටි දසදහසක් සක්වළ ශක්‍ර බ්‍රහ්ම සුයාම සන්තුසිත සුනිර්මිතාදිවූ සියලූ දිව්‍යබ්‍රහ්මයෝ මේ එක මඟුල්සක්වළටරැස්ව දැන් තුසිත භවනයෙහි වසන ඒ මෛත්‍රෙය බෝසතාණන් වහන්සේ කරා එළඹ මහාපුරුෂයාණන් වහන්ස දැන් තුඹවහන්සේ බුදුවන්නට කලැයි ආරාධනා කරන්නාහ, එකල මහබෝසතාණෝ:—

කාලං දෙසංච දීපංච කුලං මාතර මේවච
එතෙ පංච විලොකෙත්වා උප්පජ්ජන්ති තථාගතා.

යනුහෙයින් පංචමහ විලොකනය කොට බුදුවන්නට කලැයි දෙවියන්ට ප්‍රතිඥාදී කෙතුමතීනම් රාජධානියෙහි සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුවන්ට අග්‍ර පුරොහිත උභයකුල පරිසුද්ධවූ ලොක ප්‍රසිද්ධවූ සුබ්‍රාහ්මණනම් පුරොහිත බ්‍රාහ්මණයාණන්නිසා බ්‍රහ්මවතීනම් බැමිණිදේවිකුස පිළිසිඳ දසඑකඩමස් ඇවෑමෙහි දසදහසක් සක්වළ මුලූ පොළොව සක්වළගල් මේරු යුගන්ධරාදීන් කම්පිතකරවා දෙතිස් පූර්වනිමිත්ත දක්වීම් ආදිවූ ජනාඥයක් ආශ්චර්ය්‍ය පහළ කෙරෙමින්

මහත්වූ උත්සවයෙන් ඉසිපතන නම් නාගවනෝද්‍යානයෙහිදී දස දහසක් සක්වළ දෙවි බඹුන් මධ්‍යයෙහි මහාබ්‍රහ්මයා අතට මවුකුසින් බිහිව පෙර දෙපෝසෙහි සඳසෙයින් දවසින්දවස වැඩෙමින් අනන්තවූ යසසින් හා මහත්වූ ශ්‍රීසෞභාග්‍යයෙන් දිව්‍යකුමාරයෙකුසේ ක්‍රමයෙන් වැඩිවිය පැමිණෙන්නාහ.

එකල අජිතනම්වූ ඒ මෛත්‍රෙය මහාබෝසතාණන්ගේ කුශලානුභාවයෙන් මහපොළොව පළාගෙණ දෙලොස්යොදුන් උස ඇති වඩ්ඪමානකය සිද්ධාජීකය චන්ද්‍රයයි මෙසේ සත්රුවන්මයවූ 'තුන් සෘතුවට සුදුසුවූ තුන්මාලිගාවෙක් පැනනැගෙයි, එයින් එකී එකී ප්‍රාසාදයෙක්ම සත් සත් මහල්වෙයි, එකී එකී මාලෙහි සොළොලක්ෂයක් කෙළලක්ෂයක් කුඩුනෙවල්වෙයි, එකී එකී ප්‍රාසාදය සිසාරා සත්රුවන්මයවූ සත් සත් පවුරුවෙයි, එසේම සත්රුවන්මයවූ සත් සත් වාසල්වෙයි, එකී එකී වාසල්දොර වෙන වෙනම වර්ණභෙද වශයෙන් සත්රුවන්මය සත් සත් තොරණවෙයි, ඒ තුන් පායෙහිම ජලසෙවෙනිවල අග පසග තුරුරුවිදෙන රණ්රසුදුල් මැවීනිබෙයි, මුදුනෙහි නගණලද සත්රුවන්මයවූ ධජ කකුල්වල ලෙලදෙන්නාවූ රත්මිණිසොභාවෙන් මුළුනුවර එකනින් නාදවෙයි, ඒ ප්‍රාසාදයන් තුන්දෙනාගේ භිත්තිවල සත්රුවන්මයවූ තාල පන්තිය සිංහ පන්තිය ව්‍යාඝ්‍ර පන්තිය හස්ති පන්තිය අශ්ව පන්තිය රථ පන්තිය මයුර පන්තිය හංස පන්තිය කොස්ලිහිණි පන්තිය බලාකා පන්තිය ගිජුලිහිණි පන්තිය ගරුඩ පන්තිය නාග පන්තිය දෙව පන්තිය බ්‍රහ්ම පන්තිය ලතා පන්තිය වෘක්ෂ පන්තිය විල් පන්තිය ක්ෂීරසාගරාදී සමුද්‍ර පන්තිය රන් පිදි පබ්බවත් නැව් පන්තිය ජම්බුදීපාදිවූ දිප පන්තිය කෙතුමතී ආදිවූ නගර පන්තිය දෙව්දුනු රත් නීල් ආදි පස්වණක් පැහැයෙන් දිලිසෙන පටිපීක පන්ත්ය යනාදී විචිත්‍ර රූපපන්ති විභාගවත්ව පෙණෙන්නාහ, තවද ඒ ප්‍රාසාද මස්තකයෙහි දවස්පතා දිව්මල් වැසි වස්නේය. ඒ ප්‍රාසාදවල එකී එකී මාලෙහි සත්දහසක් සත්දහසක් රුවන්ගබඩා සරහා පිළියෙලකරණලද වෛඩුර්‍යමාණික්‍යමයවූ සත්දහස්සක් සත්දහසක් සිංහාසනය, සත්රුවන්මය ලීටි ඇති සත්දහසක් සත්දහසක් ධවලාතපත්‍රය නානාවර්ණ මනහර ඇතිරිලි අතුරණලද සත්දහසක් සත්දහසක් රුවනින්විසිතුරුවූ යානාවල්ය, සත්දහසක් සත්දහසක් රණකොත්ය, එකී එකී ප්‍රාසාදය සිසාරා ඡද්දන්ත නම් හස්තිරාජයා ප්‍රධානකොට ඇති සත්දහසක් සත්දහසක් මඞ්ගල්‍ය හස්තීහු නොයෙක් ගජාලඞ්කාරයෙන් සරහා සිටිති. එසේම වලාහක නම් අශ්වරාජයා ප්‍රධානකොටඇති සත්දහසක් සත්දහසක් අශ්වයෝ සරහා සිටිති, සත්රුවන් ධවජමාලාවෙන් හොබනා ගිරිමඬුලුසේ බබලන සත්දහසක් සත්දහසක් රථපන්ති සරහා තිබෙයි, එකී එකී මාලෙහි සත්දහසක් සත්දහසක් නාටිකස්ත්‍රීහු සැරහීසිටිති. ඔවුන් හැමදෙනාටම ප්‍රධානවූ අගමෙහෙසුන් බිසව චන්ද්‍රමුඛී නම්වෙති, ඈ තොමෝ ඉතා විශිෂ්ට

රූ ඇතියහ, සිදුසැටක් පමණ ස්ත්‍රී ලක්ෂණයෙන් යුක්තවූවාහු ඉතා උස්නොවෙති, ඉතා මිටි නොවෙති, ඉතා කෘශ නොවෙති, ඉතා ස්ථූල නොවෙති, ඉතා කලු නොවෙති, ඉතා එළලු නොවෙති, මනුෂ්‍ය රූපය ඉක්ම දිව්‍ය රූපයට පැමිණෙන්නාහ, ඒ බිසවුන්ගේ ශරීරයෙන් සඳුන් සුවඳ හමයි, මුඛයෙන් මහනෙල්මල් සුවඳ වහනයවෙයි, ශරීරාලෝකය දෙළොස්රියනක පැතිර සිටිනේය, පොලාපු පුළුන්පිඩක් මෙන් මොළොක්වූ ශරීර ඇතියහ, අට්ඨි කල්‍යාණය මාංස කල්‍යාණය ඡවි කල්‍යාණය කෙශ කල්‍යාණය වය කල්‍යාණයයි කියනලද පඤ්ච කල්‍යාණයෙන් සමන්විතවෙති. එම ජනවියෙහි රහත්ව නිවන්දක්නට තිසි කුසල් ඇතිහෙයින් පඤ්චමාතම්භාවය ඇතිවෙයි.

එහෙයින් කියනලදී.

චිරමුපචිත නානා පුඤ්ඤසම්භාරභාරා
වරිමහවිකා භූතා චාරු රූපූප පන්නා,
මුදුසුරභිසුඛන්තා චන්දචන්තාභි දන්තා
භවති ඉති මනුස්සා බොධිසත්තා සඤ්ඤා.

තවද මහබෝසතාණන්ගේ පුතනුවෝ බ්‍රහ්මවර්ධන නම් කුමාර වෙති, ඒ බ්‍රහ්මවර්ධන නම් කුමාරයන් ප්‍රධානකොට ඇති දහසක් පුත්‍රයෝ වන්නාහ, එකි එකී ප්‍රාසාදයෙක සොදහන් සොදහන් පමණ පුළුල ගැඹුර ඇති නිධානසැල සතරෙක් පිරිසිටිනේය. ඒ ප්‍රාසාදවල සතර සතර කොන කප්රුක් සතරෙක් පොළොවපළා නැගී නොයෙක් වස්ත්‍රාභරණාදියෙන් සැරසී සිටිතේය. අජිත නම් මහබෝසතාණෝ තුමූ සර්වාභරණයෙන් සැරසී එසේම නොයෙක් වස්ත්‍රාලංකාරයෙන් සැරසුනාවූ භාවභාවලීලාවෙන් යුක්තව ස්ත්‍රී සමූහයා විසින් පිරිවරණලදුව එකි එකී ප්‍රාසාදයෙක සාතුවිශයෙන් අවුරුදු දහසක් බැගින් පඤ්චකාම සම්පත් අනුභවකොට වාසය කරන්නාහ, එහෙයින් කියනලදී.

විවිධරතන භූමිං නෙකචිත්‍රාදි රම්මං
සුරභිකුසුමදාමං නච්චගීතාභිරාමං,
පරමයුවති පුණ්ණං නෙක සොභාව කිණ්ණං
රතනමය විමානං හොති තස්සා'ධිවාසං.

එකල ඒ අජිතනම් බෝසතාණන්ගේ කුශලානුභාවයෙන් ශුභනෙ කියනලද විතතසන්තාන ඇතිව දසදහසක් සොදුන් මුලු දඹදිව සුවාසූ දහසක් රාජධානිවල වසන සේනාවාහන සහිත සුවාසූදහසක් රජුන් පිරිවරකොට ඇති සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුවන් හා සෙසු බොහෝ දිව්‍ය මනුෂ්‍යයෝ මහබෝසතාණන් කර එළඹ මහාපුරුෂයාණන් වහන්ස! අපි හැම නුඹවහන්සේට සේවයකාරණු පිණිස ආම්හයි කියති, එසඳ මහබෝසතාණෝ ,මාගේ පශීන් බොහෝය, නොප

තොපගේ වාහසළුනාවලටම ගොස් රාජ්‍ය ශ්‍රී අනුභවකරවයි ඒ රජ දරුවන්ට හා දිව්‍යබ්‍රහ්මාදීන්ට සමෘද්ධි යවන්නාහ. එකල බෝසතානන් හා සමග දෙව්ලොවින් අවුත් එම කෙතුමතීනම් රාජධානියෙහි උතුම් කුලගෙවල උපන්නාවූ අටකෙළක් පමණ ඇමති පුත්‍රයෝ මහබෝස තුන්ට නිරතුරුව අරගෙණ සිටිති. මෙසේ ඒ මහබෝසතාණෝ දිව්‍යසම්පත්තියක් හා සමාන මහත්වූ ශ්‍රී සම්පත් අනුභවකෙරෙමින් අටදහසක් අවුරුදු මුලුල්ලෙහි ගිහිගෙයි වැස උද්‍යානගමන මාර්ගයෙහි දෙවියන් විසින් ක්‍රමයෙන් මවා දක්වනලද ජරාරූවෙක ලෙඩරුවෙක මලරුවෙක යන තුන් පූර්වනිමිත්තද්‍යක ඈසර කලකිරී යෞවන මදය ආරොග්‍ය මදය ජීවිත මදය යන ත්‍රිවිධ මදයහැර සතරවන දෙවියන් විසින් මවා දක්වනලද තපස්වී රූපය දැක මහණවීමෙහි අභිප්‍රාය උපදවා මහත්වූ සන්තොෂයෙන් දහවල් උයන්කෙළිකෙළ දෙවියන් විසින් සරහනලද රාජමාර්ගයෙන් නුවරට අවුත් වැද සත්මහල් පායෙහි ඇතුල්වූ මතුමහල්තලයට පැනනැගී සුවඳතෙල් වත්කර රත්වැට පහණින් දිලියෙන්නාවූ ශ්‍රී යහන් ගබඩාවට වැද කාය විවෙකයෙන් යුක්තව සත්දවසක් මුළුල්ලෙහි ප්‍රධන්වීර්‍යයකොට හැම සර්වඥයන්ගේ බුදුවීමවූ එකාන්තයෙන් නියතවූ වෙසගපුණු පොහොය පැමිණිකල්හි චන්ද්‍රමුඛී නම් අගමෙහෙසුන් බිසව බ්‍රහ්මවර්ධන නම් පුත්රුවන වැදූදිනයෙහි මහාභිනිෂ්ක්‍රමන් නික්මෙනු කැමතිවන්නාහ. මහබෝසතුන්ගේ චිත්තානුවාද නුභාව සියලු දසදහසක් සක්වළ දෙවතාවෝ එකෙණෙහි මේ මගුල්සක්වළට රැස්වන්නාහ, සුවාසූදහසක් රාජධානින් යුක්තවූ මුලු දඹදිව්තෙලෙහි අද අජිත කුමාරයෝ මහාභිනික්මන් නික්මෙන්නාහයි එකකෝලාහල වන්නේය. එකෙණෙහි සංඛනම් චක්‍රවර්ති රජ්ජුරුවෝ සුවාසූදහසක් නාටක ස්ත්‍රීන් හා සතිස් යොදුනෙක පැතිරසිටි මහසෙනග පිරිවරා නොයෙක් පූජා භාණ්ඩ ගෙණ අවුත් මහබෝසතාණන් හුන් රන්පාය සිසාරා සිටගන්නාහ, අවශෙෂවූ ක්ෂත්‍රිය බ්‍රාහමණ වෛශ්‍ය ශුද්‍ර උපාසක උපාසිකාවරුන් හා යටකියනලද අන්තඃපුර පිරිපුර රට දනව්වැසි සියලු ජන සමූහයෝ සුවඳමල් සුවඳසුණු සුවඳදුම් ධජ පතාක කූඩ කොඩි කෙහෙල්ගස් පුන්කලස මල්ඇගෑ මල්තොරණ මල්මාලා මල්කරඬු ආදි ගත් අත්ඇතිව එම පහය පිරිවරා ගන්නාහ. ආකාශයෙහි දෙවතාවෝ ක්ෂණ වෙස්ගෙණ දිවමල් දිවසුවඳ ආදිය ගත් අත්ඇතිව සාධුකාර නාදයෙන් හා දිව්‍යගන්ධර්ව ධ්වනි ඝොෂාවෙන් අකනිටා බඹලොව දක්වා එකනින් නාදකෙරෙමින් සිටිනාහ. චක්‍රවාට පර්වත අගනිවා හවන ආදියෙහි සිටියාවූ දිව්‍ය බ්‍රහමයන් විසින් රන් රිදී මිණි පබළු පිළිවහන ලොහිතාංක මැසිරිගල් සත්රුවන්මය දිවකරඬුවලින් පුර පුරා දමනලද සුවඳමල් සුවඳසුණු ආදීයෙන් සියලු මිලුපොළව අතුරු නැති වත්තේය. එකල මහබෝසතාණෝ මහාභිනික්මන් කෙරෙ

මියි සිතූ සිත හා සමග වැඩහුන් සත්රුවන් මහපාය සත්පවුරු සත් දෙරටු හා එක්ව අග්‍ර මෙහෙසිකාවන් ඇතුලුව බෝසතුන් පිරිවරා සිටි නාටුනාංටකයන් හා සමග දෙවන සඳමඬලක්සේ අහසට පැනනැගී යෙයි. එකෙණෙහි පිරිවරාසිටි සියලු පමින් මහාබෝසතාණන්ගේ කුශලානුභාවයෙන් හා ඒ චක්‍රවර්ති රජුරුවන්ගේ රාජානුභාවයෙන් හා සිටි සිටි තැනින්ම අහසට පැනනැගෙන්නාහ. යම් යම් කෙණෙක් මහබෝසතුන් හා එක්ව නික්මෙනු කැමති වෙද්ද ඒ ඒ සත්වයන් ආකාශයෙහිදීම තම තමන් දක්නාහ, එකෙණෙහි දසදහසක් සක්වල දසදහසක් පමණ බ්‍රහ්මරාජයෝ තුන් යොදුන් පමණ දසදහසක් සේසත්ගෙණ මහබෝසතුන් මස්තකයට දරන්නාහ. එසේම දසදහ සක් සක්‍රයෝ එක්සිය විසිරියන් ජයතුරාසක් තුඩ තබා පිඹිමින් නික් මෙන්නාහ, දසදහසක් සුයම් දෙව්රජහු දසදහසක් වල්විදුනාගෙණ සලමින් සිටින්නාහ. දසදහසක් සන්තුසිත දෙව්රජහු දසදහසක් මැණික් තල්වැට ගෙණ සලන්නාහ පංචසිඛ නම්වූ දසදහසක් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෝ බෙළුවපාඩුව නම්වූ දසදහසක් වීණාගෙණ ගායනාකරමින් සිටිනාහ. සතලිස් සතලිස් දහසක් වරම් දෙව්රජහු කඩුගත් අත් ඇතිව සතරදිග රැකවල් ගෙණ සිටිනාහ. දෙතිස් දිව්‍යාඞ්ගණාවන් හා දෙතිස් දිව්‍යපුත්‍රයෝ දිව්සුවඳ මල් හා සුවඳ සුණු පිරූ රන් රිදී මැණික්මය කරඬු ආදියගත් අත් ඇතිව සුවඳින් මලින් පුදා සිටිනාහ. එසේම කඩුගත් අත් ඇතිව අටසීයක් සෙනෙවියෝ රැකවල් ගෙණ සිටිනාහ. හාත්පසින් දිව්‍යමයවූ රන්ධජ රිදීධජ ආදිය ගත් අත් ඇතිව අසුරයෝ සිටිනාහ. මිණිදඬුවැට පහන්ගෙණ දිව්‍ය නාග රාජයෝ සිටිනාහ. සතුති ගායණ කෙරෙමින් දිව්‍යගරුඩ රාජයෝ සිටිනාහ. මධුරස්වර වීහිදුවා ගායණකරමින් කිම්පුරුෂයෝ හා කිණ්ණරාඞ්ගනාවෝද සිටිනාහ. එසේ හෙයින් කියනලදී.

මනො ර මා කිණ්ණර කිණ්ණරඞ්ගණා
මනො ර මඞ්ගා මනුරඞ්කුරඞ්ගණා
මනො ර මෙතම්පිඝී නච්චගීතියො
මනො ර මෙ තෙ කපවත්තියන්ති තෙ.

කාවද දිව්‍යනැටුම් නට නටා ගායනාකෙරෙමින් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞ්ගණාවෝ දසදික්හි සිටිනාහ. මෙසේ මෙබඳුවූ ශ්‍රී සෞභාග්‍යයෙන් සමෘඬවූ දිව්‍ය මනුෂ්‍යාදීන් විසින් පිරිවරණලදුව මහ බෝසතාණෝ පර්වතයන්ගේ නැටීමෙන් හා ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා අසුන්ගේ හෙෂාරවයෙන් හා සිංහයන්ගේ සිංහනාදයෙන් හා ව්‍යාඝ්‍රයන්ගේ නාදසහිත පැලඹීමෙන් හා යක්ෂයන්ගේ තුෂ්ටිරාවයෙන් හා දෙවියන්ගේ සාධුනාදයෙන් හා අසුරයන්ගේ සතුනිඝොෂාවෙන් හා බ්‍රහ්මයන්ගේ අත්පොලසන් හා එකනින්නාද එකනිඝොෂවූ ආකාශ තලය සරහමින් ප්‍රාසාදයෙන්බහා බෝමැඩ සමීපයටපැමිණ ප්‍රාසාදය

ගාසමින ආකාශයෙන් බස්නාහ. එකෙණෙහි මහාබ්‍රහ්මයා දිව්‍යමයවූ අටපිරිකර ගෙණ ආකල එතැන්හි මහාබෝසතාණෝ ප්‍රාසාදයෙන් බැස රන්කඩුවෙන් කෙස්වැටිය කපා ආකාශයට දමා මහාබ්‍රහ්මයා අතින් අටපිරිකර පිළිගෙණ ප්‍රාසාද මාරයෙහිදී මහණ වන්නාහ. මෙසේ මෛත්‍රෙය බෝධිසත්වයන් වහන්සේ මහණවූ දවස්ම වෙදත්‍රයෙහි පරතෙරට පැමිණියාවූ සුවාසූදහසක් බ්‍රාහ්මණයෝ බෝධිසත්වයන්ට අනුව මහණවන්නාහ. ඉසිදත්තය පුරාණය යන බ්‍රාහ්මණ දෙබෑකෙණෙක් සුවාසූදහසක් පිරිවරගෙණ එම විටම මහණවන්නාහ. ජිතමිත්‍රය විජිතමිත්‍රය යන පණ්ඩිතවරු දෙදෙනෙක් අග ධර්මදෙශනාවෙහිදීම රහත්වන්ට නිසි කුසල ඇත්තාහු සුවාසූදහසක් සුවාසූදහසක් පිරිවරගෙණ එම විටම මහණවන්නාහ. සිඩාඪී නම් සටාන කෙනෙක් සුවාසූදහසක් උපාසක පමිණ් හා සමග මහණ වන්නාහ. සුධනා නම් උපාසිකා කෙණෙක් සුවාසූදහසක් උපාසිකාවරුන් හා සමග මහණ වන්නාහ. මේ බුද්ධොත්පාදයෙහි පින්කල යසවතීය විසාඛාය යන ප්‍රසිඩ සෙහෙළියෝ දෙදෙනෙක් සුවාසූදහසක් සුවාසූදහසක් ස්ත්‍රී පුරුෂයන් පිරිවරා මහණවෙති. එසේම අන්තඃපුර පිරිපුර දනවුවැසි රජ බමුණු වෙළඳ නොයි සතර පක්ෂයෙහි බොහෝ සත්වයෝද නොයෙක් ජාති ඇති අවශෙෂ ලක්ෂණෙන් මහජනයෝද එමදුව මහණවෙති. වදාරණ ලදැයි.

චතුරාසීති සහස්සානි බ්‍රාහ්මණා වෙදපාරගූ
මෙත්තෙය්‍යස්මිං පබ්බජිතෙ-පබ්බජිස්සන්ති තෙ තදා.

මෙසේ මහබෝසතාණන් මහාභිනිෂ්ක්‍රමන් නික්ම මහණව සීල සංවර සමාදානය කොට ගහට බැස ජලස්නානය කිරීමෙන් ශරීරය සාතුනත්වා වඤ්ජුඹීනම් බිසවුන් එසින් එලවතලද දිව්‍යඕජස් බහාලූ මිහිරි කිරිබත වලඳා තලිය උඩුගංබලා නාගභවනයට හැර පුෂ්පඵල පලලවයෙන් සැරසුනාවූ වනලැහැබෙක දිවා විහරණයකොට සවස් වේලෙහි දෙවියන් විසින් සරහනලද මාර්ගයෙන් දසදහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මයන් විසින් පිරිවරණලදුව නොයෙක් පූජෝත්සවයෙන් නොස් එක්තරා පුරුෂයක්හු විසින් එලවතලද හිතණ අටමිටක්ගෙණ දක්ෂිණ දිශාභාගයෙන් නාග ශ්‍රී බෝධි සමීපයට පැමිණ තුන්යලක් පැදකුණුකොට පරීක්ෂාකරණලද අවිජහිත අපරාජිත ස්ථානයෙහි හිතණ සලා වගුරුවා එකෙණෙහිම මහපොළොව පලාගෙණ පැන නැංනාවූ අපරාජිත ජයපර්‍යඞ්කයට පැන නැගී බෝකඳට පිටලා නැගෙණහිරට මුහුනලා වජ්‍රාසන මස්තකයෙහි චතුරඞ්ග වීර්‍යාධිෂ්ඨානයෙන් පලක්බැඳ හිඳිනාසේක. එකෙණෙහි වසවර්ති මාරයා තමාගේ දිව්‍යලොකයෙහි සිටියේම බෝධිපර්‍යඞ්කාරූඪව මහබෝසතාණන් වහන්සේ සිව්රගතුටා බුදුවන්ට වැඩහුන්බව දැන ඔහු අද බුදු විය නොදෙමියි දෙකකුල ගෙණ පරසක්වල ගසමියි වාසිබෙණෙමින් ක්‍රොධ සහිතව,

නානා 'නනායතලවණ්ණසිරොරුහාය
රත්තාරුවට්ටබහි නිගතලොචනාය
දට්ඨොට්ඨභිංසන මුඛායුරගබ්භුජාය
සේනාය සො පරිවුතො විවිධායුධාය.

යනාදීන් දක්වනලද ප්‍රකාර ඇති භයානකවූ දසබිම්බරක් මර සෙනග ගෙණ සක්වල මුවපිටබැස කරනමා බලා ඒ මෛත්‍රෙය බෝසතුන්ගේ මෛත්‍රිපිඩක්බදුවූ මුඛය දුක ලංවියනොහී හයින් වෙවුලා පැරද පලායෙයි. එකෙනෙහි සහශ්‍රරශ්මින් හෙබියාවූ පනස් යොදුන් හිරුමඬල නිම්වලල්ලෙහි ගෙණ මහාසමුද්‍රයෙහි ගලන්නා ස්වර්ණ චක්‍රයක්මෙන් හස්තපර්වතයට යමින් සිටින්නේය. සියලු චක්‍රවාටගර්භය ක්ෂීරසාගරයෙහි ගලන්නාක්මෙන්ද නිම්වලල්ල අල්වාගෙණ ආකාශයට නගින්නාවූ රජත චක්‍රයක්මෙන්ද දසදික් ප්‍රභා විහිදුවමින් උනු පනස් යොදුන් චන්ද්‍රමණ්ඩලය නැගෙණහිර සක්වලමුවවිටින් උත්තරවෙමින් සිටියේය.

එසඳ මහාබෝසතානෝ තමන්ගේ රත්වන්වූ ශරීරාලොකයෙන් චක්‍රවාට මධ්‍යයෙහි බොධිමණ්ඩල ප්‍රදෙශය රත්රසයෙහි ගලන්නාක්මෙන්ද එකපැහැ බබුලුවමින් ඉඳිනාහුය, ඔවුනොවුන් පිරිවරා දසදහසක් සක්වල බ්‍රහ්ම සුයාම සන්තුසිතාදිවූ දිව්‍යසමූහයෝ මහාභිනික්මන් නික්මෙන වේලෙහි සෙයින් තමතමන්ට අනුරූපවූ ඡත්‍ර චාමර අටමඟල සොළොස්මඟලාදීවූ පූජාභාණ්ඩ හා අනෙක ප්‍රකාර තූර්යභාණ්ඩ ගෙන නානාප්‍රකාර නෘත්‍ය දක්වමින් ගී කිය කියා සතුති කෙරෙමින් සිටිනාහ. සියලු ආකාශතලය දිවමල් දිවසුවඳ වර්ෂාවෙන් අතුරු නැතිවන්නේය. එසඳ මහාපුරුෂයානන් වහන්සේ චක්‍රවාට පර්වත නැමති තිරයෙන් වටකරණලද තාරකා නැමති මැණික් කර්මාන්තයෙන් විසිතුරුවූ ආකාශ නැමති වියන්ඇති සකල රාත්‍රියෙහි එකාකාරයෙන් දිලිහෙන්නාවූ චන්ද්‍ර මණ්ඩල නැමති ප්‍රදීපාලොක ඇතිව චක්‍රවාටගර්භ නැමති රත්න මණ්ඩපයෙහි බොධිද්‍රුම නැමති මරකතමාණික්‍යමය ඡත්‍රයකින් යුක්ත වජ්‍රාසන නැමති සිංහාසන මස්තකයෙහි නාටක ස්ත්‍රීන් සහිත දිව්‍ය මනුෂ්‍ය සේනාව පිරිවරා වැඩහුන් සේක් ප්‍රථමයාමයෙහි පූර්වේනිවාසානුස්මෘති ඥානය ස ම ධි ග ම කො ට මධ්‍යමයාමයෙහි දිව්‍යචක්ෂුරභිඥානය ප්‍රතිවෙධ කොට පශ්චිමයාමයෙහි ද්වාදශාඞ්ග ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය අනුලොම ප්‍රතිලොමාදිවශයෙන් සම්මර්ශනයකෙරෙමින් අරුණොද්ගමනය හා සමග සියලු දසදහසක් සක්වල එකනින්නාදකොට දසබල චතුවෛශාරද්‍යාදී සියලු ගුණසමූහයෙන් හෙබියාවූ සර්වඥතාඥානය ප්‍රතිවෙධකොට ලොව්තුරා බුදුවන සේක.

එකණෙහි ප්‍රතිසන්ධිග්‍රහණ දිනයෙහි මෙන් දෙතිස් පූර්වනිමිති පහළවෙයි. දසදහසක් සක්වළ වටකොට හකුලුවා දමාලූ මල් වටක්සේද ඝණකොට හපුරුවා බඳනාලද මල්කලඹක් මෙන්ද මනාකොට සරහනලද මලස්නක්මෙන්ද දිව්‍යමානුසිකවූ නන් කුසුමයෙන් සැරසෙන්නේය. මෙසේ මුලුලෙංව ඒකොතසව කරවා නොයෙක් පෙළහැර පහළකෙරෙමින් ප්‍රතිවෙධකරණලද සර්‍වඥතාඥාන ඇති ඒ මෛත්‍රෙය සර්‍වඥයන්වහන්සේ "අනෙක ජාති සංසාරං" යනාදින් ප්‍රීති වාක්‍යය පවත්වා නොයෙක් කෙළ ලක්‍ෂගණන් සමාපත්තියට සමවදිමින් බෝමැඩ සමීපයෙහිම සත්සතියවා අටවෙනි සතියෙහි ධර්‍ම ගම්භිරත්වය ප්‍රත්‍යවෙක්‍ෂකොට බ්‍රහ්මාරාධනාව පිළිගෙණ ඉසිපතනනම් නාගවනොද්‍යානයටම වැඩ වපින් සියක් යොදුනෙක පැතිර සිටියාවූ මනුෂ්‍ය සේනාව හා එසේම වපින් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පනස්යොදුන් සක්වලගැබපුරා සිටි දිව්‍යසේනාව මධ්‍යයෙහි වැඩහිඳ:-

දුක්ඛං දුක්ඛ සමුප්පාදං—දුක්ඛස්සච අතික්කමං
අරියං චට්ඨඞ්ගිකං මග්ගං—දුක්ඛුප සමගාමිනං.

යනාදීන් ක්‍රමයෙන් දක්වනලද ත්‍රිපරිවෘත්තය හා ද්වාදසාකාරයක් ඇති දුඃඛසත්‍යය, සමුදසත්‍යය, නිරොධසත්‍යය, මාර්‍ගසත්‍යය යන චතුරාර්‍ය්‍යසත්‍යයෙන් යුක්ත ව නිරන්තරයෙන් ධර්‍මචක්‍රය පවත්වනසේක. එකල මනුෂ්‍යයන්ගෙන් කෙළලක්‍ෂයක් දෙනා සතරමග සතරඵලයට පැමිණ අමාමහ නිවන්දක්නාහ. දිව්‍යබ්‍රහ්මයන්ගෙන් මාර්‍ගඵල ලැබ නිවන්දක්නාහු මෙතෙකැයි පමණ නැතියහ. එයින් වදාලහ.

උපෙච්චාඋය්‍යානවරං ඵුල්ලං නාගවනං ජිනො
අනුත්තරං ධම්මචක්කං එවංසො වත්තයිස්සති.

මෙසේ ඒ මෛත්‍රෙය සර්‍වඥයන් වහන්සේ දම්සක් පවත්වා ලොකාපිසිද්ධිය කරණකල්හි සංඛ නම් චක්‍රවර්ත්ති රජ්ජුරුවෝ තමන් බොහෝකලක් රජසිරි විඳ විසූ පස්විසි යොදුන් පමණ ඇති සත්රුවන් මහපාය බුදුපාමෙක් මහාසංඝයාවහන්සේට සංඝාරාම කොට පිළිගන්වා එයින් මත්තෙහි දුගී මගී යාචකයන්ට මහදන්දී නාටක ස්ත්‍රීන් සහිත අග්‍රමහෙසිකාවන් හා සමග මහත්වූ රාජානුභාවයෙන් දිලිහි දිලිහී අපරියන්තවූ සේනා වාහනයෙන් යුක්තව ඒ මෛත්‍රෙය සර්‍වඥයන් වහන්සේකරා එළැඹ අමා ගඟෙක ගැලෙන් නාක්හුමෙන් බුදුන්ගේ චරණතබයෙහි ගැලී භක්තිප්‍රෙමයෙන් බැස නෙව වැද එකත්පස්වහිඳ අශ්‍රැතපූර්වවූ සද්ධර්‍මය අසා පහන්සිත් ඇතිව අනූ කෙළ දහසක් පමණ පුරුෂ ස්ත්‍රීන් හා සමග මාර්‍ගඵලයට පැමිණ එහි භික්‍ෂුභාවයෙන් මහණ වන්නාහ:—වදාරණලදමැයි.

තදාසො සංඛරාජාව පාසාදං රතනාමයං
ජිනස්ස පාමොක්ඛස්ස නීය්‍යාදෙත්වා පුනාපරං

තවද සියලු දිව්‍ය මනුෂ්‍යයෝම ඒ මෛත්‍රෙය බුදුරජාණන් වහන්සේකරා එළැඹ ශ්‍රොතාපත්ති මාර්ගය ඵලය සකෘදාගාමි මාර්ගය ඵලය අනාගාමි මාර්ගය ඵලය අර්හත් මාර්ගය ඵලය යන සතරමඟ සතර ඵලයෙන් උතුම් අර්හත්ඵලය උදෙසා ප්‍රශ්න විචාරන්නාහ. එසඳ බුදුහු ඒ අර්හත්ඵලප්‍රාප්තියට උපායක් දක්වමින් ප්‍රශ්න ව්‍යාකරණය කරණසේක. ඒ ප්‍රශ්න විසර්ජනය හෙතුකොටගෙණ දිව්‍ය මනුෂ්‍යයන්ගෙන් අසූකෙළදහසක් දෙන සංසාරසාගරයෙන් ගොඩ නැගෙන්නාහ, හෙවත් ශොක පරිදෙව දුඃඛ දෞර්මනස්සුපායාස නැමති ජලයෙන් හරිතවූ ජාති ජරා ව්‍යාධි මරණ නැමති මහත්වූ රළ පතර බිඳිමිඇති ලොභ ද්වේෂ මොහ මදමාන මාත්සර්‍ය්‍යාදී මත්ස්‍ය සමූහයාගෙන් ගැවසීගත්තාවූ ග්‍රහරාක්ෂසියයි කියනලද ස්ත්‍රීජනයන්ට වාසස්ථානවූ හෙවත් මාතුගාම නැමති උදක රාක්ෂසීයන්ගෙන් ගැවසීගත්තාවූ තෘෂ්ණා නැමති ගංගාජලය වැදීමට පිහිටවූ රූප ශබ්දාදි පංචකාම කොට්ඨාශ නැමති සලාවැටුම් ඇති පමණ නොදතහැකි දීග සරය ගැඹුර ඇති පරතෙරක් දක්ක නොහැකි සංසාර නැමති සාගරයෙහි චුති ප්‍රතිසන්ධි වශයෙන් ගැලෙමින් ඉපිලෙමින් විතර්ක නැමති තරංගවෙගයෙන් පහරණ ලදුව කෙලෙස් නැමති සැඩවතුරෙන් ගෙණයන ලදුව අපාය නැමති වඩබා මුඛයෙහි වැටී අනර්ථව්‍යසනයට පැමිණෙන්නාවූ සත්ත්වවර්ගයා දේශනා නැමති හස්තයෙන් ඔසවාගෙණ එබඳු සංසාර නැමති සාගරයෙන් ගොඩනගා අමාමහනිවන් නැමති අභයපුරයෙහි පිහිටුවන සේක.

මෙසේ වරින්වර ධර්මදේශනා කෙරෙමින් රහත්බවට පමුණුවන ලද ආර්‍ය්‍යශ්‍රාවකයන් වහන්සේගෙන් කොළලක්ෂයක් පමණ මහා ක්ෂීණශ්‍රාවකයන්වහන්සේ හැමකල්හිම ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ පිරිවරා ඇවිදිනසේක. ඒ හැමදෙනා වහන්සේම පූර්වෙනිවාසානුස්මෘති ඥානය දිව්‍යචක්ෂුරභිඥානය දිව්‍ය ශ්‍රොත ඥානය චෙතොපරියාය ඥානය ඍද්ධිවිධඥානය ආශ්‍රවක්ෂයකරාභි ඥානය යන මේ ෂට් අභිඥාවෙන් හා අධිෂ්ඨාන ඍද්ධිය විකුර්වණ ඍද්ධිය මනොමය ඍද්ධිය ඥානවිස්ථාර ඍද්ධිය සමාධිවිස්ථාර ඍද්ධිය අර්‍ය්‍ය ඍද්ධිය කර්මවිපාකජ පුණ්‍යවතො ඍද්ධිය විජ්ජාමය ඍද්ධිය ප්‍රයෝග ඍද්ධිය යනමේ දශවිධ ඍද්ධීන් යුක්තසේක.

තවද අර්ථපටිසම්භිදාය ධර්මපටිසම්භිදාය නිරුක්තිපටිසම්භිදාය ප්‍රතිභානපටිසම්භිදාය යන සිව්පිළිසිඹියාවෙහි දක්ෂසේක. ප්‍රගුණව වාචොද්ගතවූ ත්‍රිපිටක බුද්ධවචනය ඇතිහෙයින් බහුශ්‍රුතසේක, සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර ශ්‍රීසද්ධර්මය දරණහෙයින් ධර්මධරසේක, දෙව්මිනිසුන් සහිත සියලු ලොකයෙහි ප්‍රසිද්ධහෙයින් ව්‍යක්තසේක, උක්තප්‍රකාරයෙන් ගුණයෙන් යුක්තහෙයින් හා සීලාදි ගුණයෙන්

සමන්විත හෙයින් සංඝශෝභන වේක. යනාදිවශයෙන් මෙන වෙන කියත් නිමාව දක්ක නොහැකි සියලු ගුණගණ්ඩයෙන් හෙබියාවූ මෙබඳු කෙලලක්ෂයක් පමණ රහතන් වහන්සේ විසින් පිරිවරණලද ඒ මෛත්‍රෙය බුද්ධරජානන් වහන්සේ සප්තකුල පර්වතයන් පිරිවරණ ලද මහාමේරු පර්වතරාජයා මෙන්ද සුපිපි රත්පියුම්වන මධ්‍යයෙහි වන් සවර්ණ නෞකාවක් මෙන්ද නොයෙක් දහස්ගණන් මිණිදඬුවැට පහන් මධ්‍යයෙහි දිලිසෙන පහන්රුකක් මෙන්ද තාරකා සමූහයා විසින් පිරිවරණලද පූර්ණ චන්ද්‍රයා මෙන්ද දහසක් රැසින් පිරිවරනලද සරත් සූර්ය මණ්ඩලය මෙන්ද සතිස් යොදුනෙක පැතිර සිටිනා පර්ෂත් මණ්ඩලයකින් පිරිවරණලද සක්විති රජක්හු මෙන්ද දිව්‍ය සමූහයා විසින් පිරිවරණලද ශක්‍රදෙවේන්ද්‍රයා මෙන්ද බ්‍රහ්ම සමූහයා විසින් පිරිවරනලද මහාබ්‍රහ්මයා මෙන්ද අතිශයින් ශොභමානව දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනු ව්‍යංජන ලක්ෂණයෙන් යුක්තව නිල පීත ලොහිතාදි විචිත්‍රවර්ණ බ්‍යාමප්‍රභා මණ්ඩලයෙන් පිරිවරණලදුව විකසිත පද්මොත්පල පුණ්ඩරිකාදීන් විසින් ප්‍රතිමණ්ඩිත ජලතලාවක් මෙන්ද තාරකා නිකරයන්ගේ රශ්මි සමූහ සපමීයෙන් දිලිසෙන්නාවූ ආකාශ තලයක්මෙන්ද ඝනඝනප්‍රභා ඉන්ද්‍රචාප විද්‍යුල්ලතා පරික්ෂිප්ත කනකගිරි ශිඛරයක් මෙන්ද තමන් වහන්සේගේ ශ්‍රී සෞභාග්‍යයෙන් මුලුලොව එකාලොක කෙරෙමින් එසේම තමන්වහන්සේගේ සකල ශ්‍රී ශොභා ශරීරයෙන් එක පැහැර නික්මෙමින් ඇඹෙරමින් සලාදෙමින් දසදිග දිවන්නාවූ නීලය පීතය ලොහිතය ඕදාතය මාඤ්ජෂ්ඨය ප්‍රභාස්වරයයි කියනලද ෂඩ්වර්ණඝන බුද්ධරශ්මි මාලාවෙන් මුලුලොව හොබවා දඹදිව තුන්සියයක් යොදුන් පමණ ඇති අන්තමණ්ඩලයෙහිද සසියයක් යොදුන් පමණ ඇති මධ්‍යමණ්ඩලයෙහිද නවසියයක් යොදුන් පමණ ඇති මහාමණ්ඩලයෙහිද සැරිසරා වඩිමින් ධර්ම දෙශනා පවත්වා මහජනයාට සවර්ග මොක්ෂ සම්පත් සාධාදෙනසේක.

එකල්හි මෛත්‍රෙය බුද්ධරජානන්වහන්සේ සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි නිරතුරුව පිරූ දාන සීලාදී දසපාරමිතාවෙන් එක ආත්මභාවයෙහිම පලදෙම්හයි සැරසී සිටියවුන්මෙන් මහත්වූ ලාභසත්කාර පවත්නාහුය. ඒ කෙසේදයත්?

එකල මෛත්‍රෙය බුදුන්ගේ කුශලානුභාවයෙන් මහාජනයෝ ඒ ඒ දිශාභාගයෙන් අන්නපාන යාන වාහන වස්ත්‍ර ගන්ධමාල දීප ධූපාදිවූ නොයෙක් දානොපකරණ සපයා සියගණන් ගැල්පුරා ගෙණවුත් දන්දෙන්ට අවකාශ නොලදින් හාත්පස කිප ගව්‍ පමණ තන්හි ගැලින්ගැල පැහැර සිටගනිති—එකල්හි ඒ ගැල් සකොහි චක්‍රනාදය හා මහාජනයාගේ කොලාහලය වටින් සතිස් යොදුනක් පමණ තන්හි පැතිර සිටිනේය, මෙසේ එකාදෙව් මහදිවයින් මෙරු,

සුගන්ධර සක්වළගල මහපොළව පුළිනුපුරා කෙළසුවහස් සක්වළ එකපැහැර බමන කොලාහලයක්සේ පසුපස්සෙහි හුන් දිව්‍යබ්‍රහ්ම නාග සුපර්ණ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදීන් හා සියදහස් ගණන් ගැල්හඩින් හා පිඹිනා සක්හඩින් හා සරණගත වජ්‍රපඤ්ජර පරදුඃඛ දුඃඛිත කරුණා නිධාන ත්‍රිභුවන චූඩාමාණික්‍ය සර්වාභරණ විභූසිත සර්වඥශිරොමාණික්‍ය දෙවාතිදෙව ශක්‍රාති ශක්‍ර බ්‍රහ්මාති බ්‍රහ්මවූ තථාගතයන් වහන්සේට පූජා පිණිස දිව්‍ය බ්‍රහ්මාදීන් පිඹිනා ජය කෝලාහල ශබ්දයෙන් හා දෙව් මිනිසුන් ගසන මිහිගුබෙර හඬින් හා තුන්යොදුන් පමණ සේසත් අනන්තෙණ දෙඅත්නගා වැඳවැඳයන බඹ පිරිවරින් හා පරසතු මල්දමින් මදාරමල් ඉසමින් තල්වැට චාමර සලමින් සතුටු සතුටු දිවසළු හිස නටවමින් පුද පිණිස නෘත්‍ය ගීත වාද්‍යාදිය පවත්වමින් එක් පසෙක්හි නික්මගත් අනන්තාපරියන්ත දිව්‍යපරිවාරයෙන් හා පෙන දහස් සුවහස් මවා කරබඳනා කණ්ඨාමාණික්‍යයෙහි ආලෝකයෙන් මුළුලොව එකාලොක කෙරෙමින් පෙරමගෙහි කඩුපුල් මල් තන තනා පෙනපතර බිම ඔබ ඔබා වදිමින් පසුබස්නා කෝසුවහස් දිව්‍යනාග පරිවාරයෙන් හා පඬවණ්ණ පිය විදහා අහස්කුස් වසා මහ පියුම් තුඩින් ගෙණ පසුපස්සෙහි ගමන්ගත් යෙල සියයක් යොදුන් ගරුඩරාජයන් සිය දහස් ගණනින් හා එබු එබූ පතුල් පිළිගන්නා පිණිස මහ පොළොව පලා නැගි මහ ගැල්සකක් පමණ මහපියුම් පැනනැගී රේණුකාදීන් අගනිටා බඹලොව දක්වා සියලු සක්වල සුවඳගන්වා ශ්‍රීපාදය දික්කල කෙණෙහි මහමෙරසේ උස්තැන් එබී වලතැන් පිරී බිම සමතලා කෙරෙමින් එබු එබූ ශ්‍රීපාදයට පූජාපිණිස මහපොළොව පලා පැන නැගි සත්රුවනින් වඩිනාමග විසිතුරු කොරෙමින් දැසු සියලු වැසියන්හා සිව්පසවනුදු සතුටුකරවමින් මහොත්සවයෙන් වැඩ මහ ජනයා විසින් මෙසේ මහොඝයක් මෙන් පවත්නලද සිව්පස දානය පිළිගනිමින් මහත්වූ පූජාසත්කාරයෙන් වඩනා ඒ මෛත්‍රෙය බුදුරජානන්වහන්සේගේ පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ වශයෙන්ද සර්‍වාපරාදය යථානු ලොමය යථානු ධර්‍මය වශයෙන්ද ත්‍රිවිධවූ සියලු ශාසනය එක මුලුලෙව්හි ව්‍යාකනාවන්නේය. සියලු ජම්බුද්වීපය භික්ෂු භික්ෂුණීන් විසින් පොරොණාලද සිව්රෙහි ආලොකයෙන් එකාලොක වෙයි, කුලගෙවලට වදනාවූද නික්මෙන්නාවූද භික්ෂු භික්ෂුණීන්ගේ චීවර මාරුතයෙන් හා අතපය දික්කිරීම් ආදියෙන් නිපන්නාවූ ශරීර මාරුතයෙන් සියලු රෝග දුක් දුරුවන්නේය. කිසිකලෙක මෙසේ මහාශ්‍රාවකයන් පිරිවරා දඹදිව ගම් නියම්ගම් රාජධානි පිළිවෙලින් දනව් සැරිසරා සත්ව විනයනයකාරණසේක. සමහර කලෙක මෛනෙශ ජනයන් පිණිස දුරුකතරගෙවා දිව්‍යලොක බ්‍රහ්මලොක අන්‍ය චක්‍රවාටානතරයෙහිද අනානතාපරිමාන සක්වල කෙලවරකොට නොසිත් ඇස්ල්ලෙක පෙනී හෙතු සම්පත් ඇති සත්වයන් අමාමහනිවන් දක්වනසේක.

එයින් වදලහ.

බොධෙය්‍යං ජනං දිස්වා සතසහස්සෙපි යොජනෙ,
ඛණෙන උපගන්ත්වාන බොධයිස්සති සො ජිනො.

තවද මූල පූර්වාභිනිහාරයෙහි කියනලද පරිද්දෙන්ම අසොකය බ්‍රහ්මදේවය යන අග්‍රශ්‍රාවක යුගමයක් හා පදුමාය සුමනාය යන අග්‍ර ශ්‍රාවිකා යුගමයක් ඇතිව සිංහනම් මහතෙරකෙනෙකුන්ගෙන් අත් පා මෙහෙවිදිති. කෙළලක්ෂයක් පමණ මහාශ්‍රාවකයන් පිරිවරා ලෝවැඩ වඩන්නාවූ ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේට සුධනය සංඝය යන පිරිවරු දෙදෙනෙක් අග්‍රඋපස්ථායක වන්නාහ. යසවතීය සංඝාය යන උපාසිකාවරු දෙදෙනෙක් අග්‍ර උපස්ථායිකා වන්නාහ ඒ මෛත්‍රෙය බුද්ධරජානන් වහන්සේ පිටදී බුදුවූ නාග ශ්‍රී බෝධියෙහි රිදීකඳක්බඳුවූ සමවටවූකඳ වට එක්සිය විසිරියන් උසය—එපමණවූ පංචමහා ශාඛාවක් ඇත්තේය—මුලපටන් අගදක්වා දෙසිය සතළිස්රියනක් උසය—නැගෙණහිර ශාඛාග්‍රයෙහි පටන් බස්නාහිර ශාඛාග්‍රයට දෙසිය සතළිස් රියනක් පමණය—දකුණුදිග ශාඛාග්‍රයෙහි පටන් උතුරුදිග ශාඛාග්‍රයට දෙසිය සතළිස් රියනක් පමණය, ශාඛාමණ්ඩලය වටින් සත්සිය විසිරියන් පමණය, ස්වර්ණකොට හසුරුවා බඳනාලද මොනරපිල් කලඹක් මෙන්ද, රිදීපළිත මස්තකයෙක්හි පිහිටියාවූ මුදුන්කුළු නැමති ඉන්ද්‍රනීල මාණික්‍යමය පර්වතයක් මෙන්ද, ඉතා ශොභමානව සියලු ප්‍රාචීමණ්ඩලය සරහමින් සිටිනේය. ඒ බොධී වෘක්ෂයෙහි ලහවු හා පඬෙරවන් පත්‍රද තුවටුවෙන් ගිලිහෙන්නාවූ පූර්ණපත්‍රද කිසිකලෙකත් නැත්තේමය. හැමකලම ඉන්ද්‍රනීල මාණික්‍යමයවූ පත්‍රපන්තීන් ගැවසී අතරතුරෙහි පබලු දළු හා සමාන මද මද පවනින් ලෙලදෙන්නාවූ ලපළුපන්තීන් සැරහී සිටිනේය. අතරතුරෙහි හටගත්තාවූ ඉඳුනිල්මිණිවන් එකි එකි කැකුලෙහි දෙමළොස් දෙමළොස් නැලියක් පමණ පැන ගන්නේය. පිපිමල් රථයක් පමණ වන්නේය. එකි එකී මලෙහි නැලියක් පමණ රේණු වන්නේය. ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ බුදුවන දවස පිපිමල් සියල්ලම අසූදහසක් හවුරුදු මුළුල්ලෙහි පරනොවී තිබෙයි. ඒ ශ්‍රී මහා නාගබොධීන් වහන්සේට හාත් පසින් තුන්යොදනක් පමණ තැන නොයෙක් පැහැඇති මලින් සැරහුනාවූ වෘක්ෂයෝ ඒ බොධීන් වහන්සේ පිරිවරා උන්වහන්සේට අභිමුඛව සිටිනාහ. එසේම නොයෙක් පැහැඇති මල් එලගන්නා ලතා ජාතීහු මනාවූ සුවඳඇති නොයෙක්පැහැයෙන් බබලන්නාවූ මල්කැන් සමූහයෙන් සැරසී දක්ෂිණාවෘත්ත ව මුක්තාමාණික්‍යයෙන් කරණලද මහ පවුරක්මෙන් බොධීන් වහන්සේ වට සිටින්නාහ. ඒ බොධීන් වහන්සේට අවටින් අඩයොදුනක්පමණ තැන්හි සියලු භූමිතලය සත්රුවන් වැල්ලෙන් ගැවසීතිබෙන්නේය. ඒ සත්රුවන් වැලිමත්තෙහි අනෙක

ප්‍රකාර වර්ණ ගන්ධයෙන් යුක්තවූ දියෙහි පිපෙන සියලු සුවඳ පුෂ්පජාති හුදු අතුට තිබෙත්නාහ. තවද එහි අතුරුනැතිව හෙළනික රත්නික සීනිද්ද බෝලිද්ද දෑසමන් ඇසල පලොල් දෙඹ කිනදෙඹ බක්මී සපුකේ දුනුකේ මුහුනමල් ආදී මල්වැසි වස්නේය. හාත්පසින් රක්තොත්පල සේවතොත්පල රක්තපද්ම සේවතපද්ම රතැඹුල හෙලැඹුල නිලුපුල් මිටියෙන් පුරණලද සුවර්ණසට පන්තීන් සැරසී තිබෙන්නේය. තවද වාසල්දෙර ආඩියෙන් යුක්ත රක්ත ප්‍රදීප මාලාවෝ වන්නාහ. බෝධිවෘක්ෂ මස්තකයෙහි ඔලම්බක පද්මයන් ඇති මල් වියන් ආකාශයෙහි බැඳ තිබෙයි. ආකාශයෙන් යන්නාවූ නොයෙක් පැහැඇති පක්ෂිසමූහයෝ මධුර නාදයෙන් පූජාකොට පැදකුණු කරමින් යන්නාහ. අතුපතර වෙලෙප් අතරෙහි සැඟවී සිදිනා පක්ෂි කෙනෙක් නම් නැත්තාහ. බ්‍රහ්මයාගේ කුශලානුභාවයෙන් උපන්නාවූ මරකත මාණික්‍යමය ඡත්‍රයෙක්හි ශ්‍රී සමෘධියමැඩ අපහාසකරන්නාක් වැනිවූ සකල ශ්‍රී සෞන්දර්යයෙන් අග්‍රප්‍රාප්තවූ ඒ ශ්‍රී මහාබොධිය අතිශයින් බබලන්නේය. නිරන්තරයෙන් දිව්‍යමනුෂ්‍යයන් සහිතව ලෝකවාසීන් විසින් කරනලද සත්කාර ගරුකාර ඇත්තේය. දිව්‍ය බ්‍රහ්ම ගරුඩ ගාන්ධර්ව ආදීහු නිරන්තරයෙන් බල බලා සිටින්නාහු තෘප්තියකට නොපැමිණෙන්නේය. ඒ ශ්‍රීමහාබොධීන් වහන්සේකරා පැමිණියාවූ රට දනව්වැසි මහජනයෝ දෙව් මිනිසුන් විසින් පුදන පුදනලද සුවඳ මල් හා සුවඳ සුණු ආදියෙහි උතුම්වූ සුගන්ධ ගන්ධය ආඝ්‍රාණය කෙරෙමින් සන්තුෂ්ටවූවාහු සතුතිකොට ගී කිය කියා නටා බස්නාහ. එහෙයින් කියනලදී.

සුපුප්ඵිතෙ සුඵ්ල පුප්ඵ භූමිතො
සමන්තතො නිග්ගත බන්ධු බන්ධුරො,
විචිත්ත සාඛා වලිපණ්ණ සංකුලො
භවෙය්‍ය නාගව්හය බොධි පාදපො.

ගතා ගතා තස්ස සුගන්ධ ගන්ධතො
පමොදිතා ජානපදා මහාජනා,
සවෙණු වීණා ථුති ගීත නච්චතො
කරොන්ති එවං සතතං මහුස්සවං.

තවද ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේගේ ශ්‍රී බුද්ධ ශරීරය අට අසූරියන් පමණ වන්නේය. සුප්‍රතිෂ්ඨිත පාදතලයෙහි පටන් දෙදන මඩලට දෙවිසිරියන් උසය, දෙදන මඩල පටන් නාභිමණ්ඩලයට දෙවිසිරියන් උසය, නාභිමණ්ඩලයෙහි පටන් අකුධාතුවට දෙවිසිරියන් උසය, අකුධාතුවෙහි පටන් සිරොධාතුවට දෙවිසිරියන් උසය, දකුණු උරමඩලෙහි පටන් වම් උරමඩලට පුළුල පස්විසිරියන් පමණය, විදුලිය දෙකක්වන් කප්වැල් සත් සත් රියන පමණය,

පස්පැදිස්නා එකි එකී ඇස් පස්රියන් පමණය, සුවර්ණ පර්වත මස්තක යක හුනු නිල් දෙව්දුනු සඟලක්වැනි සශ්‍රීකවූ බැමසඟල පස් පස් රියන් පමණය, බිඹුවැල් දෙකක් හා සමාන අතිරක්තවූ තොල් සඟල පස් පස් රියන් පමණය, ඉතා සිනිඳුවූ මොලොක්වූ අති රක්ත දිග පුළුල්වූ ජිහ්වාධාතුව දසරියන් පමණය, සිරෝධාතුව වටින් පස්විසි රියන් පමණය, එසේම රන්කැඩපතක් හා සමානවූ මුඛමණ්ඩලය වටින් පස්විසි රියන් පමණය, රන් මිහිඟුබෙරයක්මෙන් සමව වටවූ ග්‍රීවාධාතුව සත්රියන් උසය, වට මටසිලිටුවූ පිරිහුන් ශ්‍රී හස්තදෙක සතළිස් සතළිස් රියන් දිගය, එකි එකි අතුල්තලය පස් පස් රියන් පමණය, සශ්‍රීකවූ ශ්‍රීපාදදෙක තෙලෙස්රියන් එක්වියත් සාඟුල් පමණ දිග ඇත්තේමැයි. වදාරණ ලදමැයි:—

අට්ඨාසීති හවෙ හත්ථා ආයාමෙනෙව සොජිනො
උරමහවෙ පණ්ණවීස වීත්ථාරා තස්ස සත්ථුනො.

මෙසේ සශ්‍රීකවූ ශ්‍රී ශරීරයක් ඇති ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ කරා රාත්‍රිදිනයෙහි එකාකාරව පවත්නා අනිමිෂ ලොචන යුගලයෙන් චතුරඞ්ග සමන්නාගත ඝනාන්ධකාරයෙහිදී හාත්පසින් එකි එකී දිගින් දොළොස් දොළොස් යොදුන් ඇතුලත්හි තුබූ අති ඇටසා සියුම් රූපයන්ද ස්ථූල සංස්කාරාදිවූ ස්ථූල රූපයන්ද දස්ාවර ණවූ මාංස චක්ෂුසෙහී ආනුභාවයෙන් අනාවරණව දක්නාසේක. තවද ඒ සර්වඥයන් වහන්සේගේ ඛ්‍යාමප්‍රභා සංඛ්‍යාත ඝණවූ රශ්මිමණ්ඩලය ආයු පමණින් නිරතුරුව පස්විසි යොදුනෙක පැතිර සිටිනේය. එසේම ඒ සර්වඥයන් වහන්සේගේ සකල ශ්‍රීශරීරය සරහා සිටගත්තාවූ දෙනිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනු ව්‍යඤ්ජන ලක්ෂණයන් කරණකොට ගෙණ තාරකා සමූහයෙන් දිලියෙන ආකාශතලයක් මෙන්ද, විකසිත පද්මොත්පල පුණ්ඩරීකයෙන් දිලියෙන්නාවූ මහ විලක් මෙන්ද, නානාප්‍රකාර මාණික්‍යාලොකයෙන් බබලන්නාවූ රුවන් ආකරයක් මෙන්ද, සන්ධ්‍යා වලාපටලයෙන් හා සියොලගරැලි විදුලිකැල, දෙව්දුනු ආදියෙන් රැඳීගිය රන්වන් පර්වතයක් මෙන්ද විශෙෂයෙන් බබලනසේක. තවද ඒ සර්වඥයන් වහන්සේගේ ශීර්ෂයො ලඟින් දිවන්නාවූ ෂට්වන්ක්ෂණ බුද්ධ රශ්මිහු ඉන්ද්‍රනීල මාණික්‍යමය ඝටයකින් නික්මුනාවූ නිල්මිණි රසධාරාවක් මෙන්ද, සුවර්ණඝටය කින් නික්මුනාවූ කුංකුම රසධාරාවක් මෙන්ද, ප්‍රවාල ඝටයකින් නික්මුනාවූ ලාක්ෂාරසධාරාවක් මෙන්ද, රජත ඝටයකින් නික්මුනාවූ ක්ෂීරරසධාරාවක් මෙන්ද, පද්මරාග මාණික්‍යමයවූ ඝටයකින් නික් මුනාවූ පියුම් රසධාරාවක් මෙන්ද, සත්රුවන් ඝටයකින් නික්මුනාවූ නා නා වර්ණ රුවන් රසධාරාවක් මෙන්ද, ඒ ඒ ස්ථානයෙන් නික්ම අතිශයින් බබල බබලා කරකැවිකැවී ජ්වාලජ්වලව රථයක් හා ෂෙස්සත්

හා කුලුගෙවල් යා පමණට දසදහසක් සක්වළ එකාවෑතව යටින් වාපොළව ඉක්ම මත්තෙහි භවාග්‍රය ඉක්ම ශාසනානතඝනය දක්වා අතුරු නැතිව ප්‍රමාණනිසු නත වක්‍රවාටවල පැතිර පවත්නාහ.

පභාහි බහාවන්ති සස ගාවුතා පණ්ණවීසති
සොභති විජ්ජුලටයිව දීපරුක්ඛොව සො ජිනො,
ලක්ඛණව්‍යංජනාරංසා දිස්සන්ති සබ්බකාලිකා
පත්තන්ති විවිධා රංසා අනෙක සතසහස්සියො.

තවද ඒ සර්වඥයන්වහන්සේ යම් තැනෙකක්හි වඩනාසේක් වීනම් එකල්හි එබු එබූ පත්ලට සුපුෂ්පිතවූ මහපියුම් පැනනැගෙයි. ඉන් එකීඑකී පද්මයක තිස් තිස්රියන් පමණ මිගපෙති වන්නේය. පස්පස් රියන් පමණ අනුපෙති වන්නේය. පියුම් කෙසරු විසිරියන් පමණ වෙයි. සොළොස්රියන් පමණ කෙමිවෙයි. එකි එකි මලෙක අමුනක් අමුනක් පමණ රේණුවෙයි. ඒ සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාදය එබූ එබූ වේලෙහි හිඟුල්සුනු හා සමානවූ ඉතා රත්පැහැ ඇති රොන්සැලා සමූහයෝ අග්‍රතාලාමුදුන් දක්වා නැගී රන් පිළිමයෙක ලාක්ෂාරස ධාරාවන් නවරත්නාක්මෙන් සකල ශරීරය හාත්පසින් තවරාගෙණ සරහමින් ශ්‍රීපාදමූලයෙහි වැහෙන්නාහුමය. අතරතුරෙහි ධවලවූ ශ්වේතපද්මයෝ පොළව පලානෙණ පැනනැගී ඒ බුදුන්ගේ පාපියුම් ශොභවන්නාහ.

වදාරණ ලදමැයි.

කෙසරා විසති හත්ථා-කණ්ණිකා සොළ සම්භවෙ,
සුරත්තාරේණු හත්ථා-පදුමා ඡත්තා සමන්තනර.

තවද එසමයෙහි ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ ගඳකිළිය සිසාරා හාත්පසින් කාමාවචර දෙවතාවන් හා දිව්‍යනාගයො අනෙක ප්‍රකාර රන්රුවන් ඇගෑදනාතීන් මවන්නාහ. එයින් ඇගෑ අටෙක් ඝණරන්මය වෙයි. අටෙක් රිදීමය වෙයි. අටෙක් මැණික්මය වෙයි. අටෙක් පබළුමය වෙයි. නොයෙක් සිය දහස් ගණන් මල්ඇගෑ හා මල්තොරන් ආදිය ගඳකිළිය සතරදිග සරහා සිටින්නේය. ඒ සියල්ලම උසින් අටාසූරියන් පමණවෙයි. මහත්වූ ආනුභාව ඇති ගරුඩ ගාන්ධර්වාදීන් හා දිව්‍යඞගනාවෝ සප්තරත්නයෙන් විචිත්‍රවූ ධ්වජමාලාවෙන් හා රන්දම් රිදීදම් මුතුදම් මැණික්දම් සුවඳමල්දම් රන්රසුදූල් මල්කලස මල්ගැන් ආදියෙන්ද හාත්පසින් එල්වනලද රන්හරු රිදීහරු මැණික්හරු ආදියෙන් විසිතුරුවූ සත්රුවන්මය වියන්න්ද සියලු රන්රුවන් ඇගෑ සරහන්නාහ. හැමකලම අනෙකප්‍රකාරදී පුවංග මල් වැසි වස්නේය. දිව්‍යමය වූ සුගන්ධ ගන්ධයෙන් අඳුනු සඳුන් සුවඳසුණු විසුරුවන්නාහ. තවද

ඒ ඇඟෑ මධ්‍යයෙහි පස්වණක් පැහැයෙන් බබලන්නාවූ නානාවර්ණාදි
පැහැයෙන් දිව්‍ය වස්ත්‍රයෝද දසදිග හොබවමින් ලෙලදිදී සිටින්නාහ.
තවද ඒ ඇඟෑතොරණ සියල්ලවම වඩා ගඳකිළිය දොරකඩ පිහිටියාවූ
දසදහසක් රියන් උස ඇති සත්රුවන්මය ඇඟෑ හා රුවන් තොරණ
සමූහය සියදහස් ගණන් විචිත්‍ර ධවජමාලාවෙන් ගැවසීගෙණ
සර්වභෝගයෙන් අලංකෘතව බැබලි බැබලී සිටියේය. ඒ ඇඟෑ
තොරණ දෙපනතිය අතුරෙහි පොළොව පලාගෙණ පැන නැගී
දෙලොස් යොදුනෙක් පමණ රත්න මණ්ඩප මධ්‍යයෙහි ස්වර්ණහාමය
ධවලාතපත්‍රයකින් හෙබියාවූ සප්තවිධ රත්නයෙන් සමලංකෘත
මාණික්‍යමය බුද්ධාසන මස්තකයෙහි භික්ෂුසංඝයා පිරිවරා වැඩහුන්
නාවූ මෛත්‍රෙය බුද්ධරජානන්වහන්සේ සතිස් යොදුනෙක පැතිරසිටි
මහපිරිස් පිරිවරා හුන් සක්විති රජක්හුමෙන්ද මහා බඹපිරිස් පිරිවරා
හුන් බ්‍රහ්මරාජයාමෙන්ද පාණ්ඩුකම්බලශෛලාශන මස්තකයෙහි
දිව්සෙනඟ පිරිවරාහුන් ශක්‍රදෙවේන්ද්‍රයා මෙන්ද සප්තකුල පර්වතාදි
යෙන් පිරිවරණලද මහාමෙරුරාජයා මෙන්ද අතිශයින්ම බබල
බබලා සියලු සත්වයන්ට ප්‍රීතිසෞම්නස් වඩවමින් දෙව් මිනිසුන්
සහිත මහජනයාට ධර්මදෙශනාකොට මාර්ගඵලයට පමුණුවනසේක.
තවද ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ කුශලානුභාවයෙන්
උපන්නාවූ ඒ මණ්ඩපය සතරකොන නිර්මිතව තිබෙන්නාවූ තිස් තිස්
රියන් පමණවූ ඝණ්ටාර සතරෙක් වන්නේය. ඒ ඝණ්ටාර සතර
පවත්නැලෙන කල්හි ඒ නාදය සියලු සක්වලගැබ පැතිර එකනින්
නාදකෙරෙයි. මෙසේ සියලු අලංකාරයෙන් හෙබියාවූ ඒ සත්රුවන්
මණ්ඩපය හා රන් ඇඟෑ රිදී ඇඟෑ මැණික් ඇඟෑ පබළු ඇඟෑ
රන්තොරන් රිදී තොරන් මැණික් තොරන් පබළු තොරන් රන්ධජ
රිදීධජ මැනික්ධජ පබළුධජ සත්රුවන්ධජ රන්දම් රිදීදම් මැණික්
දම් පබලුදම් සත්රුවන්දම් සුවඳමල්දම් රන්කලශ රිදීකලශ සත්
රුවන් කලස රන්පැන රිදීපැන සත්රුවන් පැන රන්මල් රිදීමල්
සත්රුවන්මල් නන් විසිතුරු දිවදුහුල් පස්වණක් පැහැ ඇති දිව
පිළි මලලොඹු රන්තරු රිදීතරු මැනික්තරු ආදිවූ සර්වරත්නයෙන්
විචිත්‍රවූ මනහර පටවියන් සුවඳමල්පිරූ රන්මාලා සුවඳසුණුපිරූ රන්
කරඬු රිදී කරඬු මැණික් කරඬු සත්රුවන් කරඬු නන්විසිතුරු රන්
කර්මාන්තකරණලද මීපිඇති රන්චාමර රිදීචාමර රන්තල්වැට රිදීතල්
වැට රන්කැඩපත් රිදීකැඩපත් ආදිවූ නොයෙක් පූජාභාණ්ඩ විශේෂය
ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ වඩනා යම් තැනකට සජීවත්වූසේ
එක්වම ගොස් පිරිවර සහිත ඒ සර්වඥයන්වහන්සේ හුන්සිටි යම්
තැනෙක දෙවියන් විසින් අල්වාගෙණ සිටිනාවූ පූජාභාණ්ඩයක්
මෙන් හැමවේලෙහිම බුදුන් පිරිවරා සිටිනේය. එකල්හි බුදුන් පුදනු
සඳහා ආවාවූ දිව්‍යබ්‍රහ්මයන් හා රජ බමුණු වෙළඳ ගොවි ආදිවූ

මහජනයෝ ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දැක අතිශයින් ප්‍රසන්නවූ සිත් ඇතිව තම තමන්ගේ පුත්‍රදාරාවන් හා සමග තිසරණම කරණකොට සරණ සීලයෙහි පිහිටන්නාහ. බුදුහු ඒ මාතිකා පර්‍ය්‍යන්තයෙහි වැඩහිඳ සමත්‍රිංශත් මහා සශ්‍රීක ලොකධාතුවද තමන්වහන්සේගේ ධර්‍මදෙශනා ශබ්දයෙන්ම අස්වා ශ්‍රවණදරණසේක. එකල ඒ රත්න මණ්ඩපයෙහි රත්නා ලොකයෙන් හා රත්රුවන් ඇගෑ ආදියෙහි සත්රුවන් ආලෝකයෙන් හා වියන් තොරන් රන් රිදී කරඬු කැඩපත් ආදියෙහි ප්‍රභා සමූහයෙන් හා ඒ මෛත්‍රෙය සර්‍වඥයන්වහන්සේගේ ශරීරාලොකයෙන් නිෂ්ප්‍රභාවූ සූර්‍ය්‍යමණ්ඩලය රාත්‍රි දිනයෙහි විභාග දක්වන්ට අසමර්ථවන්නේය. බුදුන්ගේ ශරීරාලෝකය අතුරු නැතිව ලොකයෙහි පැතිර සිටිනේය.

එසමයෙහි සවස උදෑසන අඬලන්නාවූ කුකුල් ආදි පක්ෂීන්ගේ ශබ්දයෙන් හා සවස පිපෙන දෑසමන් සීනිද්ද බෝලිද්ද සේඵාලිකාදි මලින් හා උදෑසන පිපෙන නාමල් සපුමල් රත්නෙලුම් හෙලනෙලුම් ඇඹුල උපුල ආදි නොයෙක් මල් සලකුණෙන්ම ලොකවාසීහු රෑ දවල යන වෙනස දැනගන්නාහ. මෙසේ ඒ මෛත්‍රෙය සර්‍වඥයන් වහන්සේ අතීත ජාතිවල බොහෝ සර්‍වඥයන්වහන්සේට කරවා පිළිගන්වනලද නොයෙක් ප්‍රාසාද මණ්ඩපවල විපාකයෙන් හා ධ්‍වජාපිණ්ඩ කරණලද රත්රුවන් ඇගෑ ආදියෙහි විපාකයෙන් උපන්නාවූ ඒ සත්රුවන් මණ්ඩපය සකල ලොකශ්‍රිය එකතැනට රැස්කොට ලූවාක්මෙන් ඉතා සශ්‍රීක වන්නේය. තවද එම මණ්ඩපයෙහි ඒ ඒ කොන සුවඳ මල් හා සුවඳ දුමින් සුවඳකරණලද, මිහිරි සිහිල් පැන් පිරූ රන් රිදී රුවන් කල හා සිව්දෑගඳකිරූ රුවන් කරඬු ආදිය අතුරු නැතිව පිළිවෙළින් සිටිනාහ. එසේම දිවසුවඳ දුමින් පිරුණු රන් රිදී පබලු මිණි සත්රුවන්මය දුම්ලොසු හා සුවඳ සුණුපිරූ රන් රිදී රුවන් කරඬු හා සුවඳතෙල් පිරූ සකල රාත්‍රියෙහි ඇවිලෙන සත්රුවන්මය පහන්රුක් පන්තීහු සතරදිග අතුරුනැතිව පිළිවෙළින් සිටිනාහ. තවද රන්පියුම් හෙළපියුම් ආදිවූ ජලජ මල් මිටි පෙළින් ගැවසීගත් රත්රුවන් ආදිවූ සප්තරත්නමය පූර්‍ණඝට පූර්‍ණකලස මාලාවෝ අතුරු නැතිව පිළිවෙළින් සිටිනාහ. ඊමත්තෙහි සර්‍වරත්නයෙන් විචිත්‍රව බබලන්නාවූ ධ්‍වජමාලාවෝ ලෙලදිදී සිටිනාහ. එසේම විචිත්‍ර රත්නයෙන් අලංකෘතවූ ධවලාතපත්‍ර පන්ති හුද හාත්පසින් අතුරු නැතිව මස්තකය හොබවා පිළිවෙළින් සිටිනාහ ඒ මෛත්‍රෙය සර්‍වඥයන්වහන්සේට උපාසකවරු ආරාධනා කොට තම තමන්ගේ ගෙවලට පූජා සත්කාරයෙන් වඩාගෙණ යන කල්හි සත්රුවන් මණ්ඩපය ආකාශයෙන් ගෙණසේ ඔවුනොවුන්ගේ ගෙදොරවල පෙරටුව පිහිටවන්නේය. ඒ මණ්ඩපයේ ලෙලදෙන්නාවූ ඝණ්ටාර නාදයෙන් බුදුන් වඩනාබව දැන සියලු මනුෂ්‍යයෝම

ඉදිරියට නික්ම පෙරගමන්කරන්නාහ. මිනිසුන් අනුරෙනි දෙවියන් හා නාගමානවකාදීහු සිවසෙන සන්ගස බොජුන් එලවා සාදර සිතින් වළඳවති. එසමයෙහි මුලුදඹදිව ඉතා දුඃඛිත සත්වයෙකු නැතිසෙයින් සර්වඥයන්වහන්සේ හා භික්ෂූන්වහන්සේ හා භික්ෂුණීන්වහන්සේ වඩාහිඳුවා අවලෝ වගීයෙහි පූජාපූප හා නොයෙක් රසමසවුලෙන් යුක්තව සූප්‍ය ඇල්සාලේ බත් වළඳවා ඉක්බිති අනුමෙවෙනි ධර්මදේශනා කරන්නාවූ ඒ සර්වඥයන් වහන්සේගේ ශබ්දය සියලු සක්වලගැබ නොපැහැර පැතිර සිටින්නේය. හැම මනුෂ්‍යයෝම තම තමන්ගේ ගෙවල සිටියාහු බුද්ධාලම්බන ප්‍රීති උපදවා රතන මණ්ඩපයෙහි ඒ ආශ්චර්යවූ ප්‍රාතිහාර්ය හා රන් රුවන් පියුම් ඇගෑ ආදිය හා සම්පත්ලාශයදුක තමතමන්ගේ ලබ්ධිය හැර තිසරණම සරණකොට පවිත්‍රලයෙහි පිහිටා බඹසරවස් රැක මාගීඵල උපදවා සකලක්ලේශයන් ප්‍රහීන කොට අහීන් ඵලයට පැමිණෙන්නාහ. සියලු ලෝකයෙහි අන්‍ය පාෂණ්ඩකෙනෙක්වත් නොසු ප්‍රව්‍රජ්‍යාවෙක්වත් නොවන්නේය. හැම දෙනම දානශීලාදී දශ පුණ්‍යක්‍රියා වස්තුවෙන් හා කාය සුචරිතාදී ත්‍රිවිධ සුචරිතයෙන් හා ත්‍රිපිටකධාරිව මාගීඵල උපදවමින් සර්වඥ ශාසනය බබුලුවා සමහර සත්වකෙනෙක් රහත්ව ඉතා පරිනිර්වාණයෙහිම අමාමහ නිවන් දක්නාහ. සමහර සත්වකෙනෙක් ඒ ඒ මාගීඵලයට අනුරූප කෙනෙක් පරිදි දිව්‍යලෝකවල හා බ්‍රහ්මලෝකවල උපදනාහ. එසමයෙහි ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ ද්වාත්‍රිංශත්වර මහා පුරුෂලක්ෂණ අශීත්‍යනුව්‍යංජන ව්‍යාමප්‍රභා කේතුමාලාලංකාරයෙන් විරාජමානවූ රූපවිලාශය හා දිව්‍ය බ්‍රහ්ම නාග ගරුඩ ගාන්ධර්වාදී සියලු සත්වයන් විසින් අතුරු නැතුව කරන්නාවූ නොයෙක් පූජා සත්කාර හා උන්වහන්සේගේ කුශලානුභාවයෙන් නිර්මිතවූ රතන මණ්ඩපය රන්රුවින් ඇගෑ සත්රුවන් තොරණ රන් රිදීමය ධජ පතාක ආදිවූ පූජාභාණ්ඩ විශේෂය හා නිත්‍ය පරිවාර කෙළලක්ෂයක් රහතන්වහන්සේ නිරන්තරව පිරිවරා ඇවිදීම් ආදිවූ නොයෙක් යස ශ්‍රී සමෘද්ධිය මෙතෙක් ප්‍රමාණයයි සර්වප්‍රකාරයෙන් සංඛ්‍යාකොට කියන්ට එබඳුම සර්වඥයන්වහන්සේ කෙනෙකුට මිස ප්‍රත්‍යක්ෂ නොව සිටි අන්‍ය සත්වයන්හට කියන්ට නොපිළිවන් වන්නේමය.

වදාරණ ලදමැයි:—

අනප්පකං පුඤ්ඤරාසිං යෙතෙනාගස්ස මහායසං
නාසක්කා සබ්බසො වත්තුං විත්ථාරෙනෙව කස්සචි.

එසේහෙයින් සියලු සත්වයන් විසින් මෙබඳුවූ නොයෙක් ආශ්චර්ය්‍යක ආදි මධ්‍යාවසාන යන ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්තකොට දරනනාවූ ශ්‍රී සද්ධර්මය අසා අමාමහ නිවන් දක්නට උත්සාහ කට යුත්තේමය.

එසමයෙහි සියලු මනුෂ්‍යයන්ටම අසූදහසක් අවුරුද්දට ආයුස්නෝය. ඒතාක්කල් මුළුල්ලෙහි ජීවත්ව වැඩහිඳිනාවූ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ මේ බුද්ධොත්පාදයෙහි කුශල්කළ බොහෝ ජන සමූහයා සංසාර සාගරයෙන් එතරකොට අමා මහ නිවන් දක්වන සේක. තවද ඥාණපරිපාකගතවූ සියලු නුවණ ඇති සත්වයන් සර්ව ප්‍රකාරයෙන් චතුස්සත්‍යාවබොධයකරවා ඥාණපරිපාකයට නොපැමිණි අවශෙෂ සත්වයන්ට නිර්වාණගාමිණී මාර්ගය මේය මේ අමාර්ගයයි මාර්ග දෙක වදාරා පවත්වනලද ශාසනධර්මය ඔබ ඇවෑමෙහිද එක්ලක්ෂ අසූ දහසක් අවුරුදු පවත්නේය. තවද ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දක්නාහු කවුරුද? නොදක්නාහු කවුරුදයත්? මාතෘඝාතක පිතෘඝාතක අරහන්ත ඝාතක ලොහිතුප්පාදක සංඝභෙදක යන පඤ්චානන්තය්‍ය්‍යකර්මය කොට අවීචි මහ නරකයෙහි උපන්නාවූ සත්වයෝ ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දක්ක නොහෙන්මය. දාගැබ් බිඳ බොධිශාඛා කපා රන් රිදී පිළිම පොකු උපුටා පොත් පත් සිඳ බිඳ ඉමසී පව් කිරීමද පඤ්චානන්තය්‍ය්‍ය පාපකර්මයට ඇතුළත්හෙයින් එවුනුත් ඒ බුදුන් දක්ක නොහෙන්මය. සංඝයාවහන්සේට අවඥා පරිභව කිනු සත්වයෝද, සිල්වතුන්ට බොරුවෙන් චිත් ඉපදවූවාහුද, ධර්මයට අනාදර කිනුවාහුද ඒ මෛත්‍රෙය බුදුන් දක්ක නොහෙන්මය. දත්වැට කෑවෝද, කුසලාං ගසා කෑවෝද, බුදුන් සතුදෙය කෑවෝද, ධර්මය සතුදෙය කෑවෝද, සාංඝිකදෙය ගසා කෑවෝද, යන මොවුන් ඒ මෛත්‍රෙය බුදුන් දක්ක නොහෙන්මය. මේ බුද්ධොත්පාදයෙහි එගා මිත්‍යාදෘෂ්ටියෙගෙණ ඇවිද්දාහුද, මෙලොවෑ නැත පරලොවෑ නැත, කම් නැත, කම්පල නැත, මවු නැත, පියා නැත, කලාවූ කුශලාකුශලයෙහි විපාක නැතැයි මෙසේ මිත්‍යාදෘෂ්ටිගෙණ ඇවිද්දාහුද ඒ මෛත්‍රෙය බුදුන් දක්ක නොහෙන්මය. හිර සඳ දෙවියන්ට ශිවලිං දෙවියන්ට දෙස්කළෝද, සෙසු අපොඝාපවාද කළාහුද ඒ මෛත්‍රෙය බුදුන් දක්ක නොහෙන්මය. නරකය, තිරිසන්යොනිය, ප්‍රෙතලොකය, අසුරනිකායයන සතරඅපායෙහි උපන්සත්වයෝද, රූතල අරූතල අසඤ්ඤතලවල සහ පරසක්වල උපන්නාහුද ඒ මෛත්‍රෙය බුදුන් දක්කනොහෙන්මය. ඉන්ද්‍රිය වෛකල්‍යයට පැමිණි සත්වයෝද ප්‍රත්‍යන්ත ජනපදයෙහි උපන් සත්වයෝද, නිගණ්ඨ ආජීවකාදී පාෂාණ්ඩයෝද ඒ මෛත්‍රෙය බුදුන් දක්ක නොහෙන්මය. තවද මේ බුද්ධොත්පාදයෙහි බණ අසා මෙලොව පරලොව දැන තම තමන් ශක්ති පමණින් දන් පින් කළාහුද, ඒ මෛත්‍රෙය බුදුන් දක්නාහුමය. තවද සිල්

රක්‍ෂාකළෝ දකිති, බණකියවා ලෝවැඩකලාහුද දකිති, දගැබ් දකරනු කරවූවෝ දකිති, පර්ණශාලා භොජනශාලා කරවූවෝ දකිති, ලිත් පින් පැන් තිබූවෝ දකිති, බුදුසසුන් ඇතිකරන්ට වහල්වූවෝ දකිති. ධර්මාසන කරවූවෝ දකිති, දණ්ඩාසන කබලි බණවසන් පොත් වසුන් ලැව්වෝ දකිති. බණකියන ගෙයි වියන් බැන්දෝ ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ දකිති, වියනෙහි මලලොඹු එල්වූවෝ දකිති, රන්මල් රිදීමල් ආදිය පිදූවෝ දකිති, සුවඳමල් සුවඳසුණු පිදූවෝ දකිති, සුවඳ දුම් ලූවෝ දකිති. බණ කියන ගෙයි පහන් දැල්වූවෝ දකිති, බණ අසන්ට හඬගෑවෝ දකිති, බණ කියනකල සාධුකාරදුන්නෝ දකිති, ධර්මකථිකයන් පයසේදූවෝ දකිති, බණ කියන ධර්මකථිකයන් ආචාර උපචාරයෙන් වඩාගෙණ ගොස් සකස්කොට බණපැවැත්වූවෝ දකිති, විජිනිපත්‍ර දුන්නෝ දකිති, බණපොත් ලියෙව්වෝ දකිති, තමන් ලියවූ පොත් අකුරු ගණනින් චක්‍රවර්ති සම්පත් ආදී සැපත් ලදින් සුව විඳ මෛත්‍රෙය බුදුන් දක්නාහුමය. තවද ආමිසදාන ධර්මදානාදියෙන් සංඝයාවහන්සේට සත්කාර කලාහු දකින්මය. මව්පියන්ට උපස්ථානකළෝ දකිති, කුලදෙටුවන්ට උපස්ථානකළෝ දකිති ලාභින් පොහෝබත් අවදිබත් දුන්නෝ දකිති, දන් පින් කිරියවත් පිරූවෝ දකිති, සංඝාරාම කරවූවෝ දකිති, පිළිමගෙවල් කරවූවෝ දකිති, පිළිම කරවා ඇස් පිහිටුවෝ දකිති, ගිලනුන්ට අත් පා මෙහෙකර් කළෝ දකිති. තවද ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දකිම්හයි පතා සට්ත්පිරිසෙසින් එක මල් මිටක් එක පහණක් එක බත් සරළුවක් පමණ දුන්නාහු, මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දකිම්හයි පතා අනුන්කළ පින් තමා සමසිතින් අනුමෝදන්වූවාහු දකින්මය. මෙසේ පින්කල සත්වයෝම එකල්හි ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ දැක බණ අසා මාර්ගඵලයට පැමිණ අමා මහ නිවන් දකිති, එපරිද්දෙන් මාර්ගඵල උපදවන්ට අසමර්ථවූවාහු සදිව්‍යලොකය මනුෂ්‍යලොකයයි යන සපතවිධ කාමාවචරයෙහි උපදිති. තිරිසන් යොනියෙහි උපන් අහෙතුක සත්වයෝද පවා හෙතුසම්පත්ලැබ මතු භවයන්හි නිර්වාණ සම්පත් ලබන්නෝමය.

මෙසේ අතීතානාගත වර්තමාන යන කාලත්‍රයවර්තිවූ සර්වඥයන් වහන්සේ විසින් සියලු දෙව් මිනිසුන්ගේ ශංකා දුරුකෙරෙමින් වර්ෂාවක් පිට වර්ෂාවක් වස්නාසේ අනාගතවංශ දෙශනාව චතුස්සත්‍යාවසාන කොට නිමවා දිව්‍ය බ්‍රහ්මාදීන් සහිත බොහෝදෙන නිර්වාණ නැමති අභයපුරයට පමුණුවාලූසේක. එහෙයින් තමහට වැඩ කැමති ශ්‍රද්ධාවත් සියළු සත්වයන් විසින්ම:—

දානං සීලං භාවනා පත්තිදානං
වෙය්‍යාවච්චං දෙසනාවානුමෝදෙ,
දිට්ඨිජ්ජුත්තං සංසුතිචාපචායො
ඤෙය්‍යෙතා එවං පුඤ්ඤවත්ථුප්පභෙදෙ

යනාදීන් දක්වනලද දශ ප්‍රකාර කුශලධර්මයන්ගේ ආනිශංස විශේෂය වෙන වෙනම නුවණින් සලකා ආදි මධ්‍ය අවසාන යන ත්‍රිවිධ චෙතනාව ශුද්ධකොට අන්නපානාදීන් දන්දීමය, පන්සිල් අටසිල් ආදිය රක්ෂාකිරීමය, හිත අහිත මධ්‍යස්ථ සියලු සත්වයන්කෙරෙහි මෛත්‍රිය පැතිරවීම් ආදිවූ භාවනාකිරීමය, තමා කල කුසලයෙහි සමාදන්කරවා අනුන්ට පින්දීමය, අනුන් කල කුශල සමසිතින් ගැන්මය, මෙරමාහට බණකීමය, අනුන් කියන බණ සාදරව ඇසීමය, වයසින් ගුණයෙන් වැඩිමහලු ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා ගිලනුන්ට උපස්ථානකිරීමය, දාන ශීලාදියෙහි ඉෂ්ටවිපාක ඇතැයි දන්නා සම්‍යක් දෘෂ්ටියෙන් විශ්වාසය ඍජුකිරීමය, පූජාවට සුදුසු ගරුතර වැඩිමහල්ලන් දැක ආදර දක්වා වැඳ පුදා සාමීචිචර්‍යායෙන් සත්කාරකිරීමය යන මේ දශ ප්‍රකාර කුශලධර්මයන් පුරා තමා ශක්ති පමණින් අප්‍රමාදව කරණලද එම කුශලානුභාවයෙන් මතු ඒ කෙතුමතීනම් රාජධානියෙහි සියලු උපභොග පරිභොග සම්පත්තීන් සමෘද්ධවූ ලොක පූජිත රජ බමුණු කුලයෙන් අන්‍යතර කුලයෙක ඉපිද මෛත්‍රෙය බුදුන් දැක බණ අසා සිව්පස දානයෙන් උපස්ථානකොට අභිප්‍රායවූ පරිද්දෙන් දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ සම්පත්තිය ක්‍රමයෙන් හස්තගතකොට අමාමහ නිවන් දකින්ට උත්සාහගත මැනවි.

දක්වන ලදමැයි:—

ඉතො චවිත්වාන කුලං මහාරහං
උපෙච්ච තො කෙතුමතී මහාපුරං
සමෙක්ඛ මෙත්තෙය්‍ය තථාගතං තදා
කරොථ භන්තෙ තිවිධම්පි සම්පදං.

---


සද්ධම්මදාන සවනෙසු මහානිසංසං
සුත්වා පසන්න මනසාය පරත්ථකාමා
භාසාය සීහල මයා කත ධම්ම මෙතං
සාධෙන්තු සංසූජන පත්ථිත සබ්බමත්ථං.

ධම්මො පවත්තතු චිරාය මුනිස්සරස්ස
ධම්මෙ ඨිතා ච සුමතී පතයො භවන්තු
කාලෙ පවත්තතු ඝනො අභිලා පජාතො
අඤ්ඤොඤ්ඤං මෙත්ති පටිලභ සුඛං ලභන්තු.

චිරං තිට්ඨතු සද්ධම්මො දෙවො සම්මා පවස්සතු
ලොකං රක්ඛන්තු රාජානො පජා පප්පොන්තු නිබ්බුතිං.

අනාගතවංශ දෙශනාව
නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු